# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,687 - 2010 දෙසැම්බර් මස 31 වැනි සිකුරාදා - 2010.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 2166 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 2167 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 2169 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 2204 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජනවාරි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


2165- B 080184—3,350 (2010/12)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

DIRF/RECT/252/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2010.06.24 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

සී/57422 කෙනි ශ්‍රී නාරායන බමුණු මුදියන්සේලාගේ අමිල සඳරුවන් බණ්ඩාර - ශ්‍රී ලංකා සංඥා බලකාය ;
සී/57420 කෙනි මිගෙල් මන්ඩාඩීගේ යොහාන් විමංග ප්‍රනාන්දු - යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ;
සී/57413 කෙනි දරුමුර හෙට්ටි ආරච්චිගෙයි තුෂාර ප්‍රියදර්ශන - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය ;
සී/57438 කෙනි කරුණාසිංහ ගෙදර මානෙල් බණ්ඩාර - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය ;
සී/57520 කෙනි දේවතා පේඩිගේ නිශාන්ත ගුණසේකර - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

12-980

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2010 ජනවාරි මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

ස්කොඩ්‍රන් ලීඩර් දොන් ප්‍රදීප් සුජීව කන්නන්ගර (01559) - පරිපාලන රෙජිමේන්තු.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 ජූනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

12-1140

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නෙරපා හැරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් නෙරපා හැරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත :

ජ්ලයිට් ලෙෆ්ටිනන්ට් බෝගොඩ ආරච්චිගේ දොන් චුල්පත්මේන්ද්‍රා ජයවර්ධන (02067) - ගුවන්තොටුපළ නිර්මාණ ශිල්පී - 2010.01.25.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

12-1141

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නෙරපා හැරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් අවඥා සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත.

ෆ්ලයින් ඔෆිසර් දොඩන්ගොඩ ගමගේ ප්‍රදීප් රොෂාන් (01747) - උපකරණ - 2010.05.10.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 19 වැනි දින,
කොළඹ දී ය.

12-1142

# රජයේ නිවේදන

අංකය : ප්‍ර. නො. 11/2/22/2010 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.01.03 වැනි දින සිට 2011.01.17 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2011.01.24 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "එම්" දරන කොට්ඨාසයේ 2722 දරන වෙළුමේ 223 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාව තුළ නුගේගොඩ කන්දේවත්ත පාර යන ගම පිහිටි තල්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 01 දරන කොටසට මර්වින් සමරනායක මානක තැනගේ 2004.08.27 වැනි දින අංක 9118 දරන පිඹුරේ ප්‍රකාර මායිම්-<br>*උතුරට* : මෙම පිඹුරේ කැබලි අංක 02 සහ කන්දේවත්ත පාර ;<br>*නැගෙනහිරට* : බී. පී. එම්. පෙරේරාට අයිති ඉඩම හා කන්දේවත්ත පාර ව. අ. 107 දරන දේපළ හා ඒ. ඒ. දෝන එලිසබෙත්ට අයිති වරිපනම් අංක 89 දරන දේපළ ;<br>*දකුණට* : කේ. ඩී. සී. සේනාරත්නට අයිති ව. අ. 13515 දරන දේපළ ;<br>*බස්නාහිරට* : ඩබ්. එල්. එම්. අබේසේකරට අයිති ව. අ. 115ඒ දරන දේපළ සහ ලොට් 02.<br>*ප්‍රමාණය* : අ. 0, රූ. 0, පර්. 21.165. | 1. ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 1389/පී හා 2005.10.28 වැනි දින දරන නඩුවේ අවසාන තීන්දු ප්‍රකාශය<br>2. - එම - සංශෝධිත |

12-1070

---

අංකය : ප්‍ර. නො. 11/2/35/20/2010 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2011.01.03 වැනි දින සිට 2011.01.17 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2011.01.24 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ජී" දරන කොට්ඨාසයේ 577 වෙළුමේ 197 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ තලංගම උතුර හා ගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමේ මැන බෙදා වෙන් කරන ලද අ. 0, රූ. 0, පර්. 30.56ක් විශාලත්වයෙන් යුත් කැබලි අංක 3 දරන බිම් කොටසට එච්. අකිල පීරිස් මානක තැනගේ 1966.07.21 වැනි දින අංක 418 දරන පිඹුරේ ප්‍රකාර මායිම්- *උතුරට* : පාර ; *නැගෙනහිරට* : කැබලි අංක 14 ; *දකුණට* : කැබලි අංක 06 ; *බස්නාහිරට* : කැබලි අංක 07 සහ 02. | 1. සී. ඒ. බී. ද ෆොන්සේකා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1981.10.27 වැනි දින ලියා සහතික කළ අංක 1464 දරන විකුණුම්කර ඔප්පුව<br>2. කොළඹ දිසා අධිකරණයේ අංක 12540/එල් දරන නඩුවේ තීන්දු ප්‍රකාශය<br>3. ඩබ්. එච්. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2005.01.29 වැනි දින ලියා සහතික කළ අංක 8598 දරන උකස් ඔප්පුව |

12-1069

---

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "කරන්දෙනිය කිරිපේද්ද, ශ්‍රී විජයසුන්දරාරාම විහාරස්ථානයේ සංඝාවාස ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වූ අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 දෙසැම්බර්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

*උපලේඛනය*

කරන්දෙනිය කිරිපේද්ද ශ්‍රී විජයසුන්දරාරාම විහාරස්ථානයේ සංඝාවාස ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වූ අරමුදල

12-1060

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1. *පොදු ප්‍රතිපත්ති* :

1.1 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය මත උපචිත සංකල්පයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

1.2 ඉංග්‍රීසි පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයට සැපයූ පොදු පහසුකම් වෙනුවෙන් දරන ලද වියදම් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු අයවීම ලෙස ගිණුම්ගතකර නොමැත.

1.3 විශ්වවිද්‍යාලයේ උපදේශන සේවා සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය (CERC) යටතේ අධ්‍යයන දෙපාර්තමේන්තු, විශ්වවිද්‍යාල මුද්‍රණාලය සහ මාධ්‍ය මන්දිරය විසින් මෙහෙය වූ විවිධ ව්‍යාපෘති සහ ඉටුකළ බාහිර පැවරුම් වෙනුවෙන් ලැබුණු මුදල් සහ වැයකළ වියදම් අතර වෙනස, විශ්ව විද්‍යාලයට වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබුන ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇත. මෙම ආදායමෙන් කොටසක් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 අනුකූලව අදාළ සංවර්ධන අරමුදල් සඳහා මාරුකර ඇත.

1.4 ගිවිසුම් හා බැඳුම්කර කඩවීම වෙනුවෙන් රු. 36,271,370.31ක මුදලක් විශ්ව විද්‍යාලයට ලැබිය යුතුව ඇත.

1.5 *සංසන්දනාත්මක තොරතුරු* :-

සැසඳීමේ පහසුව සඳහා පෙර වර්ෂයට අදාළ ශේෂයන් ප්‍රශ්තුත වර්ෂයේ වර්ගීකරණයන් සමග සැසඳෙන පරිදි නැවත වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

1.6 පර්යේෂණ කටයුතු සඳහා ජාතික අධ්‍යාපන පදනමින් සහ වෙනත් ආයතන වෙතින් ලැබුණු මුදල් ජංගම වගකීම් යටතේ පෙන්නුම්කර ඇත. රජයේ ප්‍රතිපාදන යටතේ පර්යේෂණ කටයුතු සඳහා වෙන්කළ මුදලින් සිදුකළ වැයවීම් වසරේ පර්යේෂණ වියදම් යටතේ ගිණුම්ගත කර ඇත.

1.7 රජයෙන් ලබාදුන් මූලධන පළමුවෙන් වියදම් නොවූ මූලධන ප්‍රතිපාදන ලෙස ගිණුම්ගත කර දෙවනුව ඒ යටතේ දැරූ සත්‍ය වියදම වැය වූ මූලධන ගිණුමට මාරුකර ඇත. පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම් සඳහා ලැබූ මූලධන ප්‍රතිපාදන ආදායම් සහ වියදම් ගිණුමෙහි ආදායමක් ලෙස පෙන්වා ඇත.

1.8 *දේපළ, පිරියත හා උපකරණ* :-

(i) වත්කම් ආගණනය කිරීම

1981 වර්ෂයේ විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසු ප්‍රථම වරට විශ්ව විද්‍යාලයේ ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයක් හා ප්‍රත්‍යාගණනයක්, වරලත් තක්සේරුකරුවෙකුගෙන් හා වරලත් ගණකාධිකාරිවරයෙකු ගෙන් සමන්විත උපදේශන කණ්ඩායමක් මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලදී. ප්‍රත්‍යාගණනය කරන ලද අගයන් ඇතුළත් කර නව ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කරන ලද අතර එම ලේඛනයට අදාළ ගැලපීම් ස්ථාවර වත්කම් ගිණුම්වල ඇතුළත් කර ඇත. මෙම හේතුවෙන් ස්ථාවර වත්කම්හි අගයෙහි සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරයි.

වර්ෂය තුළ මිල දී ගත් සියලු වත්කම් ඒවායේ පිරිවැයට ගිණුම්ගතකර ඇත. 2009.12.31 වැනි දිනට පෙර මිලදී ගත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද අගයට පෙන්නුම් කර ඇත.

(ii) විවිධ ව්‍යාපෘතීන්වලින් මිලදී ගනු ලැබූ දේපළ, පිරියත හා උපකරණවල අගයන් ව්‍යාපෘති ගිණුමින් බාහිර ප්‍රතිපාදන යටතේ මූලධන ගිණුමට ලැබුණු දායකත්ව ගිණුමට මාරුකර ඇත.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24ට අනුව, ප්‍රදානයන් ලෙස ලැබුණු දේපළ පිරියත හා උපකරණවල වටිනාකම ඒවායේ ජීව කාලය පදනම් කරගෙන ආදායමක් ලෙස ප්‍රාග්ධනිත හා ක්‍රමක්ෂය කිරීම් කර ඇත.

(iv) බදු පදනම මත ලබාගත් රු. 3,112,240.00 වටිනා මෝටර් කාර් රථය මෝටර් වාහන යටතේ පෙන්වා ඇත.

(v) දේපළ පිරියත හා උපකරණ ඒවායේ සමුච්චිත ක්ෂය අඩුකළ වටිනාකම මත පෙන්වා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995.10.05 වැනි දින දරන චක්‍රලේඛ අංක 649ට අනුව, සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් අනුපාතයන් යටතේ සෑම වසරක් සඳහාම ක්ෂයකිරීම් කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 05% |
| ගෘහ භාණ්ඩ | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 20% |
| මෝටර් රථ වාහන | 20% |
| රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| උපාධි ලෝගු | 20% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 20% |

වත්කම් මිළදී ගත් දින සිට ක්ෂය ගණනය කරයි. වත්කම්වල ප්‍රත්‍යාගණිත අගය මත ක්ෂය ගණනය කළ බැවින් වත්කම් ක්ෂය වටිනාකම ද ප්‍රමාණාත්මක වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

1.9 පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් :

විශ්ව විද්‍යාල සේවයේ වසර 5 ක් සම්පූර්ණ කල සියලුම සේවකයන් සඳහා එසේ සම්පූර්ණ කළ වසරේ සිට සම්පූර්ණ විශ්‍රාමික පාරිතෝෂික ප්‍රතිපාදන අදාල ගිණුම්වල වෙන්කර ඇත. මෙම වෙන් කිරීම් කර ඇත්තේ බාහිර ප්‍රතිපාදන වලින් නොවේ.

2. *වගකීම් හා වෙන් කිරීම් :*

2.1 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කළ දින පැවැති සියලුම හඳුනාගත් වගකීම් ගිණුම්ගත කර ඇත.

2.2 අධිකරණය/කම්කරු විනිශ්චය සභාව විසින් එතෙක් තීන්දු ලබානොදුන් අසම්භව්‍ය වගකීම් සඳහා වෙන් කිරීම් සිදුකර නොමැත.

3. *ආදායම් සහ වියදම් :*

3.1 ආදායම් හඳුනාගැනීම

රජයෙන් ලැබුණු ප්‍රදාණයන්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබුණු ප්‍රදානයන්, පාඨමාලා ගාස්තු සහ විවිධ අභ්‍යන්තර කටයුතු මගින් ලැබුණු ආදායම් තුලින් විශ්ව විද්‍යාල ආදායම සංයුක්ත වී ඇත. ආයෝජන මත ලැබුණු පොළී ආදායම කාල විභජන පදනම යටතේ පෙන්නුම්කර ඇත. රජයෙන් ලැබුණු ප්‍රතිපාදන ඒවා ලැබුණු පදනම මත ගිණුම්ගත කර ඇත. පාඨමාලා ගාස්තු ශිෂ්‍යයන්ගෙන් එකතුකර ගනු ලබන අවස්ථාවේ දී ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

3.2 වියදම් හඳුනාගැනීම

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදුන් උපදෙස් සහ පොදු ආකෘතිය අනුව විශ්ව විද්‍යාලයේ වියදම් ව්‍යාපෘති වර්ගීකරණය කර ඇත.

3.3 දුරස්ථ අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය

විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම්, දේපළ හා පිරියත සංවර්ධනය, උපකරණ සහ ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනයට සහ උපදේශාත්මක ද්‍රව්‍ය සංවර්ධනය උදෙසා ආසියානු සංවර්ධන බැංකු අරමුදලේ ව්‍යාපෘතියක් වන දුරස්ථ අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය මගින් මුල්‍ය පහසුකම් සලසා ඇත.

**විගණන මතය :**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම අනුව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත් පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මුල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මුල්‍ය ප්‍රථිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**2009.12.31 වැනි දිනට ශේෂ පත්‍රය**

| ***2008.12.31*** *රු.* | **වත්කම්** | | ***2009.12.31*** *රු.* |
|---|---|---|---|
| | ජංගම නොවන වත්කම් : | | |
| 48,55,2770.54 | දේපළ පිරියත හා උපකරණ | 8,20,17,03,075.19 | |
| | කෙරීගෙන යන මූලධන කාර්යයන් | 4,91,26,816.11 | |
| 7,56,60,835.84 | ආයෝජන | 9,63,22,652.87 | |
| 56,11,83,606.38 | | | 8,34,71,52,544.17 |

| *2009.12.31* *රු.* | | | *2009.12.31* *රු.* |
|---|---|---|---|
| | **ජංගම වත්කම්** | | |
| 4,97,20,291.03 | තොග | 5,04,05,960.65 | |
| 50,31,072.28 | ලැබිය යුතු මුදල් | 4,62,69,431.93 | |
| 3,14,49,660.37 | සේවක ණය හා අත්තිකාරම් | 3,64,86,993.79 | |
| 1,24,48,040.86 | අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 87,84,406.30 | |
| | මාර්ගස්ථ මුදල් | - | |
| 6,27,29,859.94 | බැංකුවේ ඇති මුදල | 2,58,10,342.10 | |
| 96,430.78 | අතැති මුදල් | 71,468.76 | 16,78,28,603.53 |
| 16,14,75,355.26 | | | |
| **72,26,58,961.64** | **මුළු වත්කම්** | | **8,51,49,81,147.70** |
| | **ස්කන්ධ හා වගකීම්** | | |
| | **ප්‍රාග්ධන හා සංචිත ප්‍රාග්ධන** | | |
| 1,06,85,57,731.03 | වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | 1.11,71,95,568.09 | |
| (14,71,278.01) | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | (91,09,115.07) | |
| | තොරතුරු තාක්ෂණය සංවර්ධන | | |
| | කටයුතු සඳහා - වි. වි. ප්‍ර. කො. ස. | | |
| 57,72,854.50 | ලැබීම් | 57,72,854.50 | |
| 97,63,364.48 | ආදායමෙන් හා පොදු සංචිතයෙන් ප්‍රාග්ධන වැය සඳහා දායකත්වය | 1,14,89,276.48 | |
| 66,86,86,092.68 | විදේශාධාර - මාධ්‍ය මන්දිරය | 66,86,86,092.68 | |
| 2,74,89,852.28 | ආධාර | 2,04,22,159.59 | |
| **1,77,87,98616.96** | | | **1,81,44,56,836.27** |
| | **සංචිත** | | |
| | **පොදු සංචිත** | | |
| (1,22,00,52,627.64) | පොදු සංචිතය | (1,57,94,20,577.72) | |
| (18,62,77,262.00 | සමුච්චිත ක්ෂය වෙන් කිරීම් | (18,62,77,262.00) | |
| (1,40,63,29,889.64) | | | (1,76,56,97,839.72) |
| | අතිරික්ත ප්‍රත්‍යාගණනය | | 8,08,00,38,972.76 |
| | **වගකීම්** | | |
| | **ජංගම නොවන වගකීම්** | | |
| 83,87,215.65 | සර්ක් අරමුදල | 86,47,741.64 | |
| 9,16,50,307.80 | විශේෂ අරමුදල් (සීමිත) | 10,60,61,750.27 | |
| 16,56,89,467.52 | පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 17,92,30,355.00 | |
| 6,65,272.64 | කල්බදු ණයහිමියෝ | 4,49,561.72 | |
| (1,13,99,37,626.03) | | | 29,43,89,408.63 |
| **63,88,60,990.93** | | | **89,42,31,87,377.94** |
| | **ජංගම වගකීම්** | | |
| 5,35,55,606.77 | ගෙවිය යුතු තැන්පතු | 6,01,33,211.72 | |
| 5,73,96,932.83 | ණයහිමියන් | 42,91,647.89 | |
| 6,29,698.21 | මුද්‍රණ කටයුතු සඳහා අත්තිකාරම් ලැබීම් - වි වි. මුද්‍රණාලය | 5,65,905.91 | |
| 2,38,72,972.90 | උපචිත වියදම් | 2,68,03,004.24 | |
| 8,37,97,970.71 | | | 9,17,93,769.76 |
| 72,26,58,961.64 | | | 8,51,49,81,147.70 |

මහාචාර්ය යූ. විදානපතිරණ, උප කුලපති.

ඩබ්. එම්. කරුණාරත්න, ලේඛකාධිකාරී.

කේ. එම්. ප්‍රේමරත්න, මුල්‍යාධිකාරී.

දිනය : 2010.04.20

## ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

### 2009.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| 2008 රු | | 2009 රු. |
|---|---|---|
| | **ආදායම්** | |
| 47,98,00,000.00 | පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදනය | 50,50,00,000.00 |
| 1,21,59,497.72 | පුනරුත්තාපන හා නඩත්තු සඳහා රජයේ ප්‍රතිපාදනය | - |
| 45,84,598.50 | අයෝජනවලින් ලැබුණු පොළී | 60,41,247.47 |
| 10,88,662.39 | ණය හා අත්තිකාරම් පොළී | 13,12,508.25 |
| 3,69,298.00 | දේපළ කුලී ආදායම් | 22,04,622.50 |
| 90,434.00 | පැරණි භාණ්ඩ විකිණීම | 7,14,846.00 |
| 3,892.00 | නිෂ්පාදිතය විකිණීම | 1,636.00 |
| 45,44,127.33 | විවිධ ලැබීම් (සටහන් 19) | 42,65,713.53 |
| 46,39,070.00 | ලියාපදිංචි ගාස්තු | 53,38,130.00 |
| 17,34,60,527.54 | අධ්‍යයන ගාස්තු (සටහන් 20) | 19.51,64,272.10 |
| 6,89,150.00 | විභාග ගාස්තු/සහතික පත්‍ර ගාස්තු | 92,400.00 |
| 4,39,030.00 | ප්‍රකාශන විකිණීම | 5,45,700.00 |
| 1,73,74,355.00 | ඉල්ලුම්පත්‍ර විකිණීම | 1,45,83,820.00 |
| 3,91,040.04 | පුස්තකාල දඩමුදල් | 4,69,007.50 |
| 1,10,768.20 | වාහන කුලියට ගැනීම් | 66,781.01 |
| 7,34,450.00 | නේවාසිකාගාර ගාස්තු | 7,37,715.00 |
| 34,47,290.00 | පහසුකම් ගාස්තු | 46,01,765.00 |
| 9,94,662.55 | වෙනත් ආදායම් | 4,81,533.53 |
| 1,26,22,253.07 | ආධාර සඳහා ක්‍රමක්ෂය | 1,02,14,421.11 |
| 71,75,43,106.34 | | 75,18,36,119.00 |
| | **වියදම්** | |
| 11,70,67,175.94 | සාමාන්‍ය පාලනය හා කාර්ය මණ්ඩල සේවා | 12,85,02,994.06 |
| 6,94,75,198.25 | ක්ෂයවීම් | 31,70,66,611.26 |
| 46,20,05,667.54 | අධ්‍යයන සේවා | 53,25,03,119.93 |
| 390,31,270.32 | ඉගැන්වීමේ සම්පත් | 5,15,08,424.95 |
| 19,27,443.15 | සෞඛ්‍ය සේවා | 20,70,088.18 |
| 1,74,52,935.60 | ඉඩම් හා ගොඩනැගිලි නඩත්තුව | 2,04,22,440.40 |
| 3,87,23,755.33 | සම්බන්ධිතා ක්‍රියාකාරකම් | 3,55,31,694.31 |
| 74,56,83,446.13 | | 1,08,76,05,373.09 |
| (2,81,40,339.79) | ආදායම ඉක්මවන වැය | (33,57,69,254.09) |
| | **පෙර අවුරුදු වෙනුවෙන් ගැලපීම්** | |
| (29.69,678.00) | පාරිතෝෂිත සඳහා වෙන් කිරීම | - |
| 6,31,992.90 | අනෙකුත් පූර්ව වර්ෂවල ගැලපීම් | (2,35,98,695.99) |
| (23,37,685.10) | | (2,35,98,695.99) |
| (1,18,95,74,602.75) | පෙර අවුරුදුවලින් ඉදිරියට ගෙනා ශේෂය | (1,22,00,52,627.64) |
| **(1,22,00,52,627.64)** | | **(157,94,20,577.72)** |

| | | |
|---|---|---|
| මහාචාර්ය යූ. විදානපතිරණ, | ඩබ්. එම්. කරුණාරත්න, | කේ. එම්. ප්‍රේමරත්න, |
| උප කුලපති. | ලේඛකාධිකාරි. | මුල්‍යාධිකාරි. |

දිනය : 2010.04.20

12-933

උපකුලපති,
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) හා III යන වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වැනි වගන්තියේ (3), (4) හා (7) යන උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2007 අගෝස්තු මස 24 වැනි දින විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 *විගණන විෂය පථය* :

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. **මූල්‍ය ප්‍රකාශන** :

2.1 *මතය* :

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමග දී ඇති සටහන්වලට (අංක 01 සිට 10 දක්වා) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම* :

2.2.1 *ගණකාධිකරණ අඩුපාඩු* :

පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය :-

(අ) ආයතන කීපයක් විසින් පරිත්‍යාග කරන ලද උපකරණ, පොත් සහ ලී බඩු වටිනාකම රු. 51,37,292ක් ගිණුම්වලට ගෙන නොතිබුණි ;

(ආ) භෞතිකව සමීක්ෂණය කරන ලද තොග ශේෂ වටිනාකම දක්වනු වෙනුවට පොත් වටිනාකම මත තොග ශේෂය රු. 36,45,875ක් ගිණුම්වල දක්වා තිබුණි ;

(ඇ) රු. 38,00,000ක් වූ ගිලන් රථයක වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි ;

(ඈ) දුරකතන රැහැන් 09ක් සවිකිරීම සඳහා දරන ලද එකතුව රු. 1,65,600ක් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබූ අතර ඒ වෙනුවට සන්නිවේදන ගිණුම යටතේ දක්වා තිබුණි ;

(ඉ) ඉකුත් වර්ෂයට අදාළව මිලදී ගන්නා ලද පරිගණක 08ක්, උපාංග හා ක්‍රීඩා භාණ්ඩ සඳහා වූ රු. 7,09,700ක ගෙවීම් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස සලකා තිබුණි ;

(ඊ) බැංකු ගිණුමක සිදුකරන ලද සෘජු හර හා බැර එකතුව පිළිවෙලින් රු. 81,33,258ක් හා රු. 20,751 විමර්ශනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි ;

(උ) නිකුත් කරන ලද දින සිට මාස 06කට වැඩි කාලයක් මුදල් නොවී ශේෂව පැවති එකතුව රු. 74,642ක් වූ චෙක්පත් 21ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2.2.2 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් :*

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ :-

(අ) විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු එකතුව රු. 1,85,38,512ක් වූ ශේෂයන් අදාළ පාර්ශවයන් විසින් සනාථ කර නොතිබුණි ;

(ආ) වර්ෂයකට වැඩි කාලයක සිට එකතුව රු. 5,33,079ක් වූ ණය ශේෂයන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විසින් නිරවුල් කර නොතිබුණි. ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව මුදල් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි ;

(ඇ) ණයගැති ශේෂ එකතුව රු. 3,55,93,121ක් සඳහා කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 *විගණනය සඳහා සාක්ෂි නොවීම :*

වියදම්වලට අදාළ ලිපිගොනු, බිල්පත්‍ර, ලැබීම් සඳහා දැන්වීම් සහ සනාථ කිරීම් නොමැති වූ බැවින් ගිණුම්වල දැක්වෙන රු. 3,15,19,521ක් වූ අයිතම පහක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

2.2.4 *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :*

පහත දැක්වෙන නීති, රජයේ මුදල් රෙගුලාසි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවීම් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට පෙන්වා දෙන ලදී :-

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය ;

(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය ;

(ඇ) *මුදල් රෙගුලාසි :*

(i) මු. රෙ. 110 ;
(ii) මු. රෙ. 396 (ඈ) ;
(iii) මු. රෙ. 700(5) ;
(iv) මු. රෙ. 702(3).

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

(i) XXVII පරිච්ඡේදය 3.1 වගන්තිය ;
(ii) XXVII පරිච්ඡේදය 9 වගන්තිය.

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ.

(i) 1997 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 48 ;
(ii) 1980 පෙබරවාරි මස 25 දිනැති අංක 63 චක්‍රලේඛයේ 6 (3) වගන්තිය ;
(iii) 2002 අගෝස්තු මස 02 වැනි දිනැති අංක 807.

2.2.5 *ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු :*

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ :-

(අ) 1994 ජූනි මස අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් මත පහත දැක්වෙන ගෙවීම් විශ්වවිද්‍යාලය මගින් අඛණ්ඩව සිදුකර තිබුණි.

| | *අයිතමය* | *2005 වර්ෂය දක්වා මුදල රු* | *2006 වර්ෂය සඳහා මුදල රු* |
|---|---|---|---|
| (i) | දෙවැනි සහ තෙවැනි භාෂා ප්‍රවීණතාවය වෙනුවෙන් දිරි දීමනා සහ වැටුප් වර්ධක | 20,45,728 | 2,62,327 |
| (ii) | අතපසු වූ වැඩ නිම කිරීම සඳහා වූ දීමනා සහ අධ්‍යයන දීමනා වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවන ලද වැඩිපුර ගෙවීම් | 16,09,654 | 14,94,037 |

(ආ) විශ්වවිද්‍යාලයේ විවිධ නිලධාරීන්ට විවිධ කරුණු සඳහා එකතුව රු. 1,01,750ක ප්‍රසාද දීමනා ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වුව ද මෙම අතිරේක ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3. *මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය* :

3.1 *මූල්‍ය කාර්ය සාධනය* :

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල* :

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩකටයුතුවලින් වූ ප්‍රතිඵලය, රු. 25,99,06,871ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 19,05,71,444ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු. 20,35,40,590ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 5,63,66,281 දක්වා අඩු වූ අතර, ඒ අනුව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 16,35,37,502ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු. 2,70,33,942ක් දක්වා අඩුවී තිබුණි.

3.1.2 *පර්යේෂණ ප්‍රදාන උපයෝජනය* :

විගණන සෝදිසි පරීක්ෂණයක දී විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ ප්‍රදාන උපයෝජනය කර ගැනීම මගින් සිදුකරන ලද කටයුතු පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය :-

(අ) එක් එක් පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘති සම්බන්ධයෙන් ලිපිගොනු පවත්වා තිබුණ ද ගිවිසුම් ආකෘති වැඩි ප්‍රමාණයක් උපකුලපති/ලේඛකාධිකාරී විසින් අත්සන් කර නොතිබුණු අතර සමහර ඉල්ලුම්පත්‍ර පර්යේෂණ ප්‍රදාන කමිටුවේ ලේකම් විසින් අත්සන් කර නොතිබුණි ;

(ආ) පර්යේෂණ කමිටුව අනුමත කළ කාලපරිච්ඡේදය තුළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකර කාලය දීර්ඝ කිරීම් ලබාගැනීම පොදු ලක්ෂණයක් විය. අසම්පූර්ණ පර්යේෂණ කටයුතු සඳහා එකතුව රු. 1,76,170ක් ගෙවා තිබුණු අතර නියමිත දින සිට වර්ෂ 04ක කාලයක් ඉක්මවා ගිය ව්‍යාපෘති ප්‍රමාදයන් වූ අවස්ථා විය. මෙම සියලුම ප්‍රදාන නිරවුල් කර ඇති බව, මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා දන්වා තිබුණි ;

(ඇ) 2006 අගෝස්තු මස 27 වැනිදා දක්වා ගෙවන ලද පර්යේෂණ ප්‍රදාන අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා අවසාන දින දීර්ඝ කිරීම ලබාදීමට සහ මෙම හිඟ අත්තිකාරම් නිරවුල් කිරීමට නොහැකි වුවහොත් පර්යේෂණ ප්‍රදාන ලබාගත් අදාළ ගුරුවරුන්ගේ වැටුපෙන් 2006 සැප්තැම්බර් මස 25 වැනිදා සිට සමාන වාරිකවලින් පර්යේෂණ ප්‍රධාන අත්තිකාරම් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට කටයුතු කරන බවට 2006 ජූලි මස 06 වැනි දින පැවැති රැස්වීමේ දී පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව (ආර්පීසී අංක 11/2006) තීරණයක් ගෙන තිබුණි. කෙසේ වුව ද මෙම තීරණය විගණන පරීක්ෂණ දිනය වන 2007 මාර්තු මස 30 වැනි දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 *ආර්ථික නොවූ ගනුදෙනු* :

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ :-

(අ) එක් පරිගණකයකට පිරිවැය සාමාන්‍යය රු. 49,000ක් බැගින් පරිගණක 17ක් වැඩි දියුණු කිරීම සඳහා එකතුව රු. 8,36,100ක් වියදම් දරා තිබුණි. කෙසේ වුවද වියදම් කරන ලද එම මුදලින් අලුත් පරිගණක මිල දී ගත හැකිව තිබූ බව පෙනේ. තව ද, එම වියදම් ප්‍රාග්ධනීත කර නොතිබුණි ;

(ආ) තෙවැනි පාර්ශවයන්ට එරෙහිව නඩු නීතිපති දෙපාර්තමේන්තුවට භාරදීම වෙනුවට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් එකතුව රු. 2,65,783ක් නීතිඥ ගාස්තු ලෙස වැය කර තිබුණි.

3.1.4 *අරමුදල් අවිධිමත් උපයෝජනය* :

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව නමට ලියන ලද රු. 75,00,000ක් වූ චෙක්පතක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර මාස 09ක ප්‍රමාදයකින් පසු සමාලෝචිත වර්ෂයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වුව ද පසුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් චෙක්පත ආපසු එවා තිබුණි. එහෙයින් සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධන වියදම් සඳහා වූ අරමුදල් උපයෝජනය නොවී පැවතුණි. තව ද මෙම මුදල ප්‍රාග්ධන අරමුදල් ගිණුමෙන් පුනරාවර්තන අරමුදල් ගිණුමට මාරුකර තිබුණි. වෙනත් කොන්ත්‍රාත්කරුවන්ට වැඩ ප්‍රදානය කළ බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා දන්වා තිබුණි ;

(ආ) ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අයි. ආර්. කිවු. යූ. ඊ. (IRQUE) අරමුදල් වෙනුවට විශ්වවිද්‍යාල අරමුදලින් රු. 6,02,803ක් වැය කර තිබුණු අතර මෙම ගොඩනැගිල්ල අයි. ආර්. කිව්. යූ. ඊ. (IRQUE) ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට අදහස් කර තිබුණි.

3.1.5 *බාහිර වියදම් :*

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ :

(අ) සිහිවටන දැන්වීමක් පුවත්පත්වල පළ කිරීම සඳහා රු. 70,010ක වියදමක් දරා තිබුණි ;

(ආ) විශ්ව විද්‍යාලයේ අරමුණු යටතේ නොවන, අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් සඳහා ද්‍රව්‍ය එකතු කිරීමට ප්‍රවාහන වියදම් ලෙස රු. 1,03,950ක් වූ ගෙවීම් සිදුකර තිබුණි.

3.2 *ඒක ශිෂ්‍ය පිරිවැය :*

විශ්ව විද්‍යාලයේ පවත්වනු ලබන පාඨමාලා 4 සඳහා ශිෂ්‍යයින් 1,370ක් ලියාපදිංචි වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ වැයකරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 26,27,10,563ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු. 1,91,760ක් විය.

3.3 *විභාග පැවැත්වීම :*

සමාලෝචිත වර්ෂය තුළ දී පවත්වන ලද විභාග, පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ විභාගවලින් සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ :

| *පීඨය* | *කාලපරිච්ඡේදය* | *විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව* | *සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව* |
|---|---|---|---|
| ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂාව | සෙමෙස්තර 1 (Semester) | 52 | 49 |
| කලා සහ සංස්කෘතිය | සෙමෙස්තර II | 728 | 616 |
| කළමනාකරණය | සෙමෙස්තර II | 275 | 209 |
| වාණිජ්‍යය | සෙමෙස්තර II | 134 | 93 |
| ව්‍යවහාරික විද්‍යාව | සෙමෙස්තර II | 234 | 134 |

3.4 *පුස්තකාල පරිපාලනය :*

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ :

(අ) කථිකාචාර්යවරයෙකුට වරකට බැහැර ගෙනයා හැකි උපරිම පොත් සංඛ්‍යාව පුස්තකාල කමිටුව විසින් තීරණය කර නොතිබුණි ;

(ආ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ 68 දෙනෙක් විශ්වවිද්‍යාලයෙන් බැහැර ගෙනගිය රු. 2,07,312ක් වටිනාකම වූ පොත් 266ක් වර්ෂ 04කට වැඩි කාලයක සිට ආපසු භාර දී නොතිබුණි. මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා ලැබිය යුතු වූ පොත්වලින් වැඩි කොටසක් පසුව අයකරගත් බව දන්වා තිබුණි ;

(ඇ) සමහර කථිකාචාර්යවරුන් පොත් ආපසු භාර නොදී ශිෂ්‍යත්ව මත විදේශගත වීම නිසා අන් අයගේ ප්‍රයෝජනය සඳහා පොත් ලබාගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා දක්වා තිබුණේ පසුව ඒවා අයකරගත් බවය.

3.5 *වත්කම් සත්‍යාපනය :*

2004, 2005 සහ 2006 වර්ෂ සඳහා විධිමත් පරිදි වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපන පවත්වා නොතිබුණි. 2004 වර්ෂය සඳහා සමීක්ෂණ වාර්තාව සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන් විසින් සහතික කර නොතිබුණි.

3.6 *අයවැය ලේඛනමය පාලනය :*

අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර විශාල විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලන**

1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාරව 2007 අගෝස්තු මස 24 වැනි දින නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාවේ දැක්වෙන විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකර ඇත. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) පැමිණීම ;
(ආ) ස්ථාවර වත්කම් ;

(ඇ) ඉන්වෙන්ටරි ලේඛන පැවැත්වීම ;
(ඈ) ණයගැතියෝ ;
(ඉ) ගිණුම්කරණය.

පී. ඒ. පේමතිලක,
*වැඩබලන විගණකාධිපති.*

අපගේ යොමුව : එෆ්ඒ/වීසී/බී/ඒජී/2006.
ඔබගේ යොමුව : එන්ඊ/ඒඑම්/බී/එස්ඊයූඑස්එල්/2006

2007 ඔක්තෝබර් මස 17 වැනි දින,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 2007 සැප්තැම්බර් මස 05 වැනි දිනැති ලිපිය හා බැඳේ. ඔබගේ විගණන කෙටුම්පත් වාර්තාවේ දක්වන ලද විමසුම් සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණයන් පහත දැක්වේ.

2. **ගිණුම්**

2.3 *ගිණුම් පිළිබඳව අදහස් දැක්වීම* :

2.3.1 *ගිණුම්කරණ අඩුපාඩු* :

(අ) සටහන් කර ගතිමි. මෙය නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත ;

(ආ) සටහන් කර ගතිමි. ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි ;

(ඇ) IRQUE ව්‍යාපෘතිය යටතේ බස් රථය මිළදී ගන්නා ලදී. වැරදීමකින් මෙය 2006 මූල්‍ය ප්‍රකාශනවල පිටු අංක 32හි "උපකරණ" යටතේ දක්වා ඇත. ඉදිරියේ දී මෙය නිවැරදි කර ගැනීමට වග බලා ගනිමු. ගිලන් රථයේ වටිනාකම දැනටමත් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කොට ඇත ;

(ඈ) සටහන් කර ගතිමි. ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි ;

(ඉ) ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි ;

(ඊ) සෘජුව කරන ලද වටිනාකම රුපියල් 74,49,333.33ක මුදල දැනටමත් සැසඳීමේ කොට ආදාල ගිණුම්වලට ගලපා ඇත. මේ වන විට සැසඳීම් කළ යුතු ශේෂය රු. 6,83,924.67ක් වේ. බැංකුවෙන් ලැබීමට නියමිත හරපත් ලද විගස මෙම මුදල සැසඳීම් කිරීමට වග බලා ගනිමු. මෙම සැසඳීම් 2007 ඔක්තෝබර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනයේ නිරූපණය කිරීමට නියමිතව ඇත. මෙම සැසඳුම් ප්‍රකාශනයේ පිටපතක් 2007 නොවැම්බර් මස තුළ දී විගණකාධිපති වෙත ඉදිරිපත් කළ හැක ;

(උ) මෙමගින් සමහර විවිධ ගෙවීම් නිරූපණය කරයි. මෙය නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.3.2 *අයවිය යුතු හා ගෙවිය යුතු ගිණුම්* :

(අ) අදාළ පාර්ශවයන් වෙත ශේෂ සනාථ කිරීම සඳහා විමසීම් යවා ඇතත්, ඒ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත.

(ආ) 2006.12.31 වැනි දිනට වසරකට වඩා කාලයක් ඉක්ම වූ අය කර නොගත් ණය ශේෂයන්, සේවයෙන් ඉල්ලා අස්වුණු, අනිවාර්ය නිවාඩු යවන ලද හෝ ගිලන් වූ සේවකයන්ට අයත් වේ. මේ දක්වා එක් සේවකයකුගෙන් සේවක අර්ථසාධක අරමුදලින් රුපියල් 24,650ක මුදලක් අයකර ගෙන ඇති අතර, අයකළ යුතුව පවතින හිඟ ශේෂයන් අදාළ සේවකයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

(ඇ) ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

2.3.3 *විගණනය සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවීම :*

වාර්තාවේ සඳහන් රු. 3,15,19,521 මුදලෙන් :

(i) රුපියල් 2,68,61,794ක් සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධන වියදම් වශයෙන් දරා ඇත. අදාළ සියලුම ලිපිගොනු සහ අවශ්‍ය සැසඳීම් ඔවුන් විසින් ඉල්ලීම් කර ඇති පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

(ii) රුපියල් 22,84,855ක් වරිපනම් හා කුලී ගාස්තු වශයෙන් වියදම් කර ඇත. නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කුලී පදනම මත නිවාස ලබාගෙන සිසුන්ට නේවාසික පහසුකම් සලසා දීමට විශ්වවිද්‍යාලයට සිදු වී ඇත. අප විසින් එම නිවාස අයිතිකරුවන් සමග ගිවිසුම්වලට එළඹ ඇති අතර ඒ අනුව සෑම මසකම අවසානයේ ගෙවීම් සිදු කරන ලදී. මෙම ගිවිසුම් පත්‍ර විගණන නිලධාරීන්ගේ පරීක්ෂාව සඳහා ඔවුන්ගේ කාර්යාලය වෙත යවන ලදී.

(iii) පුරප්පාඩුව පවතින වෛද්‍ය නිලධාරී තනතුර පිරවීම සඳහා පළ කරන ලද දැන්වීම සඳහා ලැබුණු ප්‍රතිචාර මද වීම හෝ ප්‍රතිචාර නොදැක්වීම හේතු කොට ගෙන විශ්වවිද්‍යාලය මගින් එම තනතුර පිරවීම සඳහා දරනු ලැබූ සියලු ප්‍රයත්නයන් ව්‍යර්ථ වී ඇත. මෙම තත්ත්වයන් යටතේ අපගේ කටයුතුවලට සහාය ලබා දෙන ලෙස යාබද රෝහලකින් අප විසින් ඉල්ලා සිටින ලදී.

(iv) රු. 12,54,711ක මුදල සේවක ආර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සම්බන්ධයෙන් වේ. මෙම ගෙවීම් ලැබුණු බවට තහවුරු කිරීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් වරින් වර එවනු ලබයි. තහවුරු කිරීම්වලින් බොහොමයක් මේ වන විටත් ලැබී ඇත.

2.3.4 *නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :*

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 18 : ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

*1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත :*

109 වගන්තිය - 2005 වර්ෂය දක්වා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ වන විටත් රජයේ මුද්‍රණාලය වෙත භාර දී ඇත.

110 වගන්තිය - ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

*ආයතන සංග්‍රහය :*

XXVII පරිච්ඡේදයේ 3 : 1 වගන්තිය අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ පැමිණීමේ ලේඛනය, අදාළ අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රධානියා විසින් පවත්වාගෙන යනු ලබයි,

XXVII පරිච්ඡේදයේ 9 වැනි වගන්තිය - වාහන සඳහා වූ ලොග් පොත් මේ වන විටත් නඩත්තු කරමින් පවතී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 63 6(3) වගන්තිය -

ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

1997 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 48-ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

මුදල් රෙගුලාසි :

අංක 110 - ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

අංක 396(ඩී) - ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

අංක 700 (5) - ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

අංක 702(3) - ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

2.3.5 *ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු :*

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ සහ මාර්ගෝපදේශනවලට අනුකූලව ගෙවීම් සිදු කොට ඇත.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ හා මාර්ගෝපදේශනවලට අනුකූලව ගෞරව බහුමාන දීමනා අනුව සිදු කොට ඇත.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ක්‍රියාකාරීත්වය

3.1.1 පර්යේෂණ ප්‍රදානයන්හි උපයෝජනය

(අ) එක් එක් පර්යේෂණ ප්‍රදානයන් සඳහා වෙන් වෙන් වශයෙන් ලිපිගොනු වෙන් වෙන් ව පවත්වා ගෙන යනු ලබයි. කෙසේ වෙතත් ලිපිගොනු තුලින් ඉස්මතු වුණු අඩුලුහුඩු කම් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ආ) සහ (ඇ)

වාර්තාවේ දක්වා ඇති එකතුව රු. 176,170ක් වූ මුදල පහත ප්‍රදානලාභීන් වෙත අත්තිකාරම් වශයෙන් ගෙවා ඇත.

එම්. එල්. ෆවුසුල් අමීර් මයා,
ආචාර්ය එස්. එම්. එම්. ඉස්මයිල්
එම්. සී. එම්. අස්වර් මයා
එස්. වර්දරාජන් මිය
ඒ. එන්. අහමඩ් මයා
එම්. ඒ. එම්. රමීස් මිය
එස්. ගුණපාලන් මයා

සියලුම ප්‍රදානලාභීන් අත්තිකාරම් මුදල් මේ වන විට පියවා ඇත. එසේ වුවත් ආචාර්ය ඉස්මයිල් මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව ඇගයීම් කිරීම සඳහා යොමු කර ඇත.

3.1.2 *ආර්ථිකමය නොවන ගණුදෙනු* :

(අ) සටහන් කර ගතිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට වගබලා ගනිමු.

(ආ) නීතිපතිතුමාගේ එකඟතාවය මත බාහිර නීතිඥවරුන් නඩු කටයුතු සඳහා වෙන් කරන ලදී. අදාළ ලියකියවිලි මේ සමඟ අමුණා ඇත. (කරුණාකර ඇමුණුම 01 බලන්න)

3.1.3 අරමුදල් අවිධිමත් ලෙස උපයෝජනය

(අ) අප සතුව පවතින නේවාසිකාගාර පහසුකම් ගැහැණු සහ පිරිමි දෙපාර්ශ්වයම ඇතුළත්ව සිසුන් 360 දෙනෙකු සඳහා ප්‍රමාණවත් වන අතර එය වැසිකිලි ඒකක දහයක ප්‍රමාණයකින් සමන්විත වේ. මෙම වැසිකිළි පද්ධතියෙහි පවතින හිඟතාවය හේතුකොටගෙන සිසුන්ට විශාල ගැටලුකාරී තත්වයක් උද්ගත වී ඇති බැවින්, අමතර වැසිකිලි පද්ධතියක දැඩි අවශ්‍යතාවයක් පැනනැගී ඇත. ඒ අනුව මෙම තත්ත්වය සමනය කිරීම පිණිස ස්නාන පහසුකම් සහිත වැසිකිළි ඒකක 15ක් ද සහ අධ්‍යයන ශාලාවක් ද ඉදිරිකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. කල්මුණේ පළාත්බඳ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව රුපියල් මිලියන 7.5 මුදලක් ඔවුන් වෙත ලබා දෙන ලදී. ඔවුන් විසින් මෙම චෙක්පත විවිධ හේතු නිසා ආපසු හරවා එවා ඇත. එසේ වුවත් පොදු ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර මෙම කටයුත්ත පසුව වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර ඇති අතර, අදාළ කටයුත්ත ක්‍රියාත්මක මට්ටමේ පවතී.
(කරුණාකර ඇමුණුම 02 බලන්න)

(ආ) ගෘහස්ත ක්‍රීඩාගාර ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 1.6ක් වේ. IRQUE ව්‍යාපෘතිය යටතේ ගෘහස්ත ක්‍රීඩාගාරයෙහි ඉදිකිරීම් කටයුතු සඳහා විශ්ව විද්‍යාලය මගින් රුපියල් මිලියන 0.6ක දායකත්වයක් ලබා දිය යුතු යැයි යන කොන්දේසියට යටත්ව ලෝක බැංකු ආධාර අනුමත වී ඇත. මෙම ව්‍යාපෘතිය යටතට ශිෂ්‍යයන්ගේ ඉගැන්වීමේ පරිසරය වර්ධනය කිරීම යන උපාංගයද අයත් වේ.

3.1.4 අක්‍රමවත් වියදම්

(අ) සටහන් කර ගතිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට වග බලා ගනිමු.

(ආ) වැරදීමකින් මෙය විශ්ව විද්‍යාල වියදම් ලෙස හරකර ඇති අතර එය "ආපදා කළමනාකරණ ගිණුම" වෙත මාරු කරනු ලැබේ. සුනාමි ව්‍යසනයෙන් අසරණ වූ (සිසුන් හා කාර්ය මණ්ඩලය) සඳහා අනුග්‍රහකත්වයක් ලබා දෙනු පිණිස සුනාමියෙන් ටික දිනකට පසුව උක්ත ගිණුම විවෘත කරන ලදී.

(ඇ) කාර්ය මණ්ඩල සාමාජිකයන් 68 දෙනෙකු විසින් ලබා ගන්නා ලද පොත් ආපසු භාර නොදීම සම්බන්ධව විශ්ව විද්‍යාල පාලක සභාව වෙත දැනුම් දුන් විට අදාල කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ මාසික වැටුපෙන් 100%ක දඩ මුදලක් සහ අදාළ පොත් සඳහා අයවිය යුතු මුළු වටිනාකම ඔවුන්ගෙන් අය කිරීමට තීරණය කරන ලදී. නව මාදිලියේ අය කර ගැනීමේ ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් කථිකාචාර්යවරුන්ගේ සේවක සංගමයන් සමඟ පැනනැගුණ ආරවුල හේතු කොට ගෙන අය කරන ලද පළමු

වාරිකය නැවත ගෙවන ලදී. කෙසේ වෙතත් නැවත අයකිරීම් පසුව එළඹුණ මාසයේ සිට නැවත ක්‍රියාත්මක කරන ලදී. අයකර ගත් මුළු මුදල වන රු. 207,312ක මුදලින් මේ දක්වා රු. 185,613ක මුදලක් අයකර ගෙන ඇති අතර රු. 21,699.24ක මුදලක් මේ වන විට ඉතුරුව පවතී.

3.2 පුස්තකාල පරිපාලනය

(අ) 1995.11.22 වැනි දින පවත්වනු ලැබූ පුස්තකාල කමිටු පළමුවන සැසිවාරයේ දී අධ්‍යයන අංශ සාමාජිකයන්, විශ්ව විද්‍යාල පරිපාලන නිලධාරීන්, කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ උපාධි අපේක්ෂකයින් සඳහා පොත් ණයට ලබා ගැනීමේ වරප්‍රසාද සම්බන්ධයෙන් හා ප්‍රතිපත්තිමය තීරණය කෙටුම්පත් කර ගන්නා ලදී. පසුව 2005.04.21 වැනි දින පැවති 27 වන පුස්තකාල කමිටු රැස්වීමේදී මෙම ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලද අතර 42 වැනි පාලක සභා රැස්වීමේදී උක්ත තීරණය අනුමත කරන ලදී. එමෙන්ම පුස්තකාලය භාවිත කරන්නන් වෙත නිකුත් කර ඇත. මාර්ගෝපදේශනයේ දක්වා ඇති නීති රීති ප්‍රතිපාදනවලට අනුව කාර්ය මණ්ඩලය පුස්තකාලයේ ලියාපදිංචි සාමාජිකයන් වේ.

(ආ) 2005.12.31 වැනි දින වන විට කාර්ය මණ්ඩල සාමාජිකයන් 68 දෙනෙකු පුස්තකාල පොත් 266ක් ආපසු භාර දී නොතිබුණි. මෙම පොත් සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන්ගෙන් පොත් වල පිරිවැය සමග 100%ක දඩ මුදලක් (දුර්ලභ ගණයේ පොත් එකතුන් සම්බන්ධයෙන් 300% ක දඩ මුදල්) අයකර ගැනීමට 2006.02.25 වැනි දින පැවති 85 වැනි පාලක සභා රැස්වීමේදී තීරණය කරන ලදී. අයකර ගත යුතු මුළු මුදල වන රු. 207,312න් රු. 185,613ක් දැනටමත් අයකර ගෙන ඇති අතර මේ වන විට රු. 21,699.24ක් ඉතිරිව පවතී.

(ඇ) පුස්තකාලයෙන් ලබාගත් පොත් නැවත බාරදී නොමැතිව කථිකාචාර්යවරුන් දෙදෙනෙක් ශිෂ්‍යත්ව සඳහා රටින් බැහැරව ගොස් ඇත. ඔවුන් සම්බන්ධයෙන් වූ මුදල් ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකත්වය නවතා දැමූ හෙයින් ඔවුන්ගේ අර්ථ සාධක අරමුදලින් අය කර ගන්නා ලදී.

3.4 බැඳුම්කර ගිවිසුම් උල්ලංඝණය කිරීම

මෙම තොරතුරු විගණන කාර්යාලය වෙත යොමු කර ඇත.

(අ) බැඳුම්කර ගිවිසුම් උල්ලංඝණය කළ කතිකාචාර්යවරුන් තිදෙනෙකුට අනිවාර්ය නිවාඩු යැවීම සඳහා දැන්වීම් නිකුත් කර ඇත.

(ආ) සහ (ඇ)

අදාළ කථිකාචාර්යවරුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

**4. පද්ධති හා පාලන**

(අ) කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම

(i) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ පැමිණීමේ ලේඛනය අදාළ අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රධානියා විසින් පවත්වාගෙන යනු ලබයි.

(ii) ස්ථාවර වත්කම් ලේඛණය විගණනය සඳහා භාර දී ඇත.

ආචාර්ය ඒ. ජී. හුසේන් ස්මයිල්,
උපකුලපති.

*පිටපත්:* (01) ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.
(02) ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.
(03) සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| *දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම්* | *සටහන්* | *2006* රු. | *2006* රු. | *2005* රු. | *2005* රු. |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් : | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 42,28,40,321 | | 38,83,09,494 | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 2 | 36,07,068 | | 33,53,890 | |

| දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් | සටහන් | 2006 රු. | 2006 රු. | 2005 රු. | 2005 රු. |
|---|---|---|---|---|---|
| | | 42,64,47,389 | 42,64,47,389 | 39,16,63,384 | 39,16,63,384 |
| කෙරිගෙන යන වැඩ | 3 | | 6,82,51,668 | | 4,35,43,310 |
| | | | 49,46,99,057 | | 43,52,06,694 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 4 | 36,45,875 | | 42,17,944 | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 5 | 4,72,50,109 | | 3,25,70,718 | |
| මුදල්, මුදල් හා සමාන දෑ | 6 | 88,15,558 | 5,97,11,542 | 53,30,740 | 4,21,19,403 |
| මුළු වත්කම් | | | 55,44,10,599 | | 47,73,26,096 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 1,90,26,978 | | 88,24,039 | |
| උපචිත වියදම් | | - | | 12,51,122 | |
| නිශ්චිත අරමුදල් | 8 | 87,22,361 | 2,77,49,339 | 48,98,982 | 1,49,74,142 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 9 | 2,86,12,143 | 2,86,12,143 | 1,23,44,859 | 1,23,44,859 |
| මුළු වගකීම් | | | 5,63,61,482 | | 2,73,19,001 |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **49,80,49,117** | | **45,00,07,095** |
| ශුද්ධ වත්කම්/හිමිකම් | | | | | |
| සමුච්චිත අරමුදල | 10 | | 75,57,19,043 | | 65,18,04,077 |
| සංචිත | | | (25,76,69,926) | | (20,17,96,981) |
| **මුළු වත්කම්/හිමිකම්** | | | **49,80,49,117** | | **45,00,07,096** |

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

වියදම් එහි ස්වභාවය අනුව වර්ගීකරණය කර නිරූපණය කර ඇත :

| *මෙහෙයුම් ආදායම* | *සටහන්* | *2006* | *2005* |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | | 11,75,00,000 | 13,97,00,000 |
| අනෙකුත් ප්‍රදාන | 11 | 2,98,44,282 | 2,64,00,389 |
| | | 20,63,44,282 | 16,61,00,389 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පෞද්ගලික පඩිනඩි | | 12,07,41,582 | 9,36,44,029 |
| ගමන් | | 18,60,004 | 21,52,018 |
| සැපයුම් සහ පාරිභෝජන භාණ්ඩ | | 77,88,831 | 57,18,597 |
| නඩත්තු | | 1,47,28,339 | 1,55,65,657 |
| ගිවිසුම්ගත සේවා | | 3,04,81,152 | 2,00,50,622 |
| පර්යේෂණ සහ ප්‍රකාශන | | 2,01,13,719 | 2,15,38,704 |
| ක්ෂය කිරීම් | | 5,55,22,126 | 2,94,13,085 |
| අයි. ආර්. ක්‍යු, යූ. ඊ. | | 1,14,74,810 | 50,51,619 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **26,27,10,563** | **19,31,34,331** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ අතිරික්තය/(ඌනතාවය)** | | **(5,63,66,281)** | **(2,70,33,942)** |

| *මෙහෙයුම් ආදායම* | *සටහන්* | *2006* | *2005* |
|---|---|---|---|
| මූල්‍ය පිරිවැය | | - | - |
| දේපළ පිරියත, උපකරණ විකිණීමෙන් ලද ආදායම | | - | - |
| මුළු මෙහෙයුම් නොවන ආදායම | | - | - |
| අසාමාන්‍ය අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | | (5,63,66,281) | (2,70,33,942) |
| පෙර වර්ෂයේ ගැලපුම් | | (4,93,336) | (8,79,950) |
| **කාලච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)** | | **(5,58,72,945)** | **(2,61,53,992)** |

### ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

**ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

*2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය* | *2006* | *2005* |
|---|---|---|
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය (ඌනතාවය) | (5,58,72,945) | (2,61,53,992) |
| මුදල් නොවන චලනයන් | | |
| ක්ෂය කිරීම් | 3,92,54,842 | 2,94,13,085 |
| වෙනත් | - | - |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම්වල වැඩිවීම | 1,62,67,284 | 29,17,375 |
| | (3,50,819) | 61,76,468 |
| සේවක පිරිවැය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම | - | - |
| ජංගම වත්කම්වල වැඩිවීම/අඩුවීම | (5,72,070) | 8,35,499 |
| ලැබිය යුතු දෑවල වැඩිවීම/අඩුවීම | 1,46,79,391 | 50,79,885 |
| ජංගම වගකීම්වල වැඩවීම/අඩුවීම | 1,27,75,197 | 31,02,495 |
| | (13,32,125) | (28,12,889) |
| මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (16,82,944) | 33,63,579 |
| අයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ සහ පිරියත මිලදී ගැනීම | 9,87,47,204 | 10,06,17,867 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (1,00,40,30,148) | (10,06,08,177) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | |
| ප්‍රාග්ධන ප්‍රධාන | 10,39,14,966 | 9,51,49,285 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 34,84,818 | (21,05,003) |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී පැවති මුදල්, මුදල් හා සමාන දෑ | 53,30,740 | 74,35,743 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී පැවති මුදල් මුදල් හා සමාන දෑ | 88,15,558 | 53,30,740 |

12-1040/1

---

### ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සහ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ 111 වැනි වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී

ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2008 අගෝස්තු මස 15 වැනි දින විශ්ව විද්‍යාලයේ උපකුලපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි, නියැදි පදනම මත පරීක්ෂා කිරීමේ, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් විය. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂයය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වැනි වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. ***මූල්‍ය ප්‍රකාශන***

2.1 *මතය* :

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2007 දෙසැම්බර් මස 31 වැනි දිවාශට : විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත් වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමග දී ඇති සටහන් වලට (අංක 2) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම් :

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

සමාලෝචිත වර්ෂය තුළදී කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතන ව්‍යාපෘතිය යටතේ රු. 9,73,104ක වියදමක් දරා තිබුණි. කෙසේ වුව ද එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය :-

(අ) පෙර වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද බාහිර කථිකාචාර්ය ගෙවීම්, දුරකථන ගාස්තු, අතිකාල, නිවාස කුලී සහ අමතර වැඩ සඳහා ගෙවීම් රු. 7,96,784ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සලකා තිබුණි.

(ආ) බැංකු ගිණුමක වූ සෘජු හර කිරීම් එකතුව රු. 34,31,063ක් පරීක්ෂා කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) පොත් අගය සහ වාහන විකිණීමෙන් ලද මුදල අතර වෙනසෙහි එකතුව රු. 19,89,74ක් සමුච්චිත ක්ෂය සැළකිල්ලට ගෙන අපහරණ ගිණුමක් සකස් නොකර පාඩුවක් ලෙස පෙන්වා තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් ශුද්ධ පාඩුව වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් අපහරණය කරන ලද මෝටර් රථවල ක්ෂය ප්‍රතිපාදනය රු. 1,23,013කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) තාප්පයක් ඉදි කිරිම සඳහා කඩා ඉවත් කරන ලද වැටක වටිනාකම වූ රු. 3,26,211 ක් අඛණ්ඩව මුල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස පෙන්වා තිබුණි.

(ඊ) සුනාමි ආපදා කාලය තුල නැතිවූ/"හානිවූ ක්‍රීඩා භාණ්ඩ වල වටිනාකම වූ රු. 22,372ක් වත්කමක් ලෙස මුල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ඃ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ ඃ-

(අ) විශ්ව විද්‍යාලයේ විසින් ගෙවිය යුතු එකතුව රු. 4,07,99,568ක ශේෂයන් අදාල පාර්ශවයන් විසින් සනාථ කර නොතිබුණි.

(ආ) විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය විසින් රු. 4,90,152ක් වූ ණය ශේෂ වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි. ගිවිසුම් වල වූ කොන්දේසි අනුව එම මුදල් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) එකතුව රු. 2,35,90,976ක් වූ ණයගැති ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

ගිණුම් වල වූ එකතුව රු. 58,88,314ක් වූ විෂයයන් හයක් ලේඛන, ලිපිගොනු, බිල්පත්, අමතර වැඩ සඳහා විස්තර, ලැබීම් ලද බවට දැන්වීම් හා තහවුරු කිරිම් නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් ඃ

පහත සඳහන් පනත්, රජයේ මුදල් රෙගුලාසි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනන සඳහා වූ ආයතන සංග්‍රහයේ විවිධ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවීම් කලින් කල විශ්ව විද්‍යාලයේ උප කුලපතිගේ අවධානයට යොමු කරන ලදී ඃ-

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය ;

(ආ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 110 වගන්තිය

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 සහ 24

(ඈ) මුදල් රෙගුලාසි අංක 110, 396(ඩී), 700(5) හා 702(3)

(ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය ඃ

(i) XXVII පරිච්ඡේදයේ 3 ඃ 1 වගන්තිය

(ii) XXVII පරිච්ඡේදයේ 9 වගන්තිය

(ඊ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ඃ

(i) 1980 පෙබරවාරි 25 වැනි දිනැති අංක 63හි 6(3) වගන්තිය

(ii) 1997 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 48

(iii) 2002 අගෝස්තු මස 02 වැනි දිනැති අංක 807

2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ ඃ-

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 95 හා 1994 ජුනි මස 14 වැනි දිනැති චක්‍රලේඛනයට පටහැනිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛන උපදෙස්වලට අනුව පහත සඳහන් ගෙවීම් දිගින් දිගටම විශ්ව විද්‍යාලය විසින් කර තිබුණි.

| *විෂයය* | *මුදල* | |
|---|---|---|
| | *2007 වර්ෂය සඳහා* *රු.* | *2006 වර්ෂය දක්වා* *රු.* |
| (i) දෙවන සහ තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් දිරි දීමනා සහ වැටුප් වර්ධක | 4,30,695 | 23,08,055 |
| (ii) අධ්‍යයන දීමනාව ගණන් ගැනීම නිසා විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට වැඩිපුර ගෙවීම් | 13,58,020 | 31,03,691 |

(ආ) විවිධ අරමුණු සඳහා විශ්වවිද්‍යාලයේ නිලධාරීන් කිහිපදෙනෙකුට එකතුව රු. 17,36,897ක් වූ ගෞරවාන්විත දීමනා ගෙවා තිබුණි. කෙසේ නමුත් මෙම අතිරේක ගෙවීම් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධිකාරිය ලබාගෙන නොතිබුණි.

2.2.7 අධිකාරය නොලත් ගෙවීම් :

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතියක් නොමැතිව වැඩ බැලීම සඳහා නිලධාරියෙකුට එකතුව රු. 4,05,219ක අතිරේක දීමානාවක් ගෙවි තිබුණි.

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියක් නොමැතිව අමතර වැඩ, ජාල පරිපාලනය, සම්බන්ධීකරණ දීමනා, නීතිමය කරුණු වැනි හේතූන් සඳහා නිලධාරීන් කිහිපදෙනෙකුට, එකතුව රු. 2,96,532ක් ගෞරවාන්විත දීමනා ගෙවා තිබුණි.

2.2.8 වැඩිපුර ගෙවීම්

යතුරු ලියන දීමනා සහ නිබන්දන පිළියෙල කිරීම සඳහා ගෙවීම් ලෙස රු. 9,000ක් ගෙවා තිබුණි. කෙසේනමුත් 1998 සැප්තැම්බර් මස 10 වැනි දිනැති අංක 740 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු සඳහා උපරිම සීමාව රු. 4,000 පමණක් විය.

**03. මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය**

3.1 *මූල්‍ය සමාලෝචනය*

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව, 2007 දෙසැම්බර් මස 31 වනි දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 295,540,594ක ඌනතාවයක් වූ අතර, පෙර වර්ෂය සමග සැසඳීමේදී අනුරූපී ඌණතාවය රු. 25,99,06,871ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු .25,10,39,826ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 4,45,00,768කට අඩු වී තිබුණු අතර, එසේම පෙර වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන රු. 20,35,40,590 ගණන් ගැනීමෙන් පසු එම වර්ෂය සඳහා ඌනතාවය රු. 56,366,28ක් දක්වා අඩු වී තිබුණි.

3.2 *මෙහෙයුම් සමාලෝචනය*

3.2.1 පර්යේෂණ ප්‍රධාන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘති සම්බන්ධයෙන් ලිපිගොනු නඩත්තු කර තිබුණි. නමුත් ගිවිසුම් ආකෘති බොහොමයක් උපකුලපති/ලේඛකාධිකාරී විසින් අත්සන් කර නොතිබුණ අතර, ඇතැම් අයදුම්පත් පර්යේෂණ ප්‍රදාන කමිටුවේ ලේකම් විසින් අත්සන් කර නොතිබුණි.

(ආ) පර්යේෂණ කමිටුව විසින් අනුමත කරනු ලැබූ නිශ්චිත කාලපරිච්ඡේය තුළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකර කාලය දීර්ඝ කර ගැනීම සාමාන්‍ය අංගයක් විය. අසම්පූර්ණ පර්යේෂණ කටයුතු සඳහා රු. 17,617ක් ගෙවා තිබුණු අතර, නියමිත දිනයට වර්ෂ 4ක කාලපරිච්ඡේදයක් ව්‍යාපෘති ප්‍රමාදවීම් අවස්ථා ද විය.

(ඇ) 2006 ජූලි මස 06 වැනි දින පැවති ආර්පීසී අංක 11/2006 දරන සාකච්ඡාවේදී හිඟව ඇති පර්යේෂණ ප්‍රදාන අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා 2006 අගෝස්තු මස 27 දක්වා අවසන් දීර්ඝ කිරීම ලබාදීමට පර්යේෂණ සහ ප්‍රසිද්ධ කිරීමේ කමිටුව (ආර්පීසී) තීරණය කර තිබුණු අතර, හිඟ හිටි අත්තිකාරම් නිරවුල් කිරීමට අසමත් වුවහොත් පර්යේෂණ ප්‍රදාන ලබාගත් ගුරුවරුන් හය දෙනකුගේ වැටුපෙන් මුලු මුදලම සමාන වාරික 04කින් 2006 සැප්තැම්බර් මස 25 වැනි දින සිට අයකර ගැනීමට ද තීරණය කර තිබුණි. කෙසේ වුව ද මෙම තීරණය 2007 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2.2 ආර්ථික නොවූ ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) ඡායා පිටපත් යන්ත්‍ර සහ පරිගනක අලුත්වැඩියා සහ උත්ශ්‍රේණිගත කිරීම සඳහා එකතුව රු. 2,51,289ක පිරිවැයක් දරා තිබුණි. කෙසේ නමුත් වියදම් කළ මුදල් සීමාව තුළ අලුත් පරිගණක මිලදී ගැනීමට හැකියාවක් තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ ඡායා පිටපත් කිරීමේ ගාස්තු වශයෙන් රු. 73,484 ක් වියදම් කර තිබුණි. නමුත් විශ්ව විද්‍යාලයේ ඡායා පිටපත් යන්ත්‍ර 25ක් පමණ තිබුණි.

(ඇ) උපකුලපතිවරයා දුරකථන මාර්ග 4ක් පාවිච්චි කර තිබුණු අතර, මුලු දුරකථන ගාස්තු මුදල රු. 2,42,525ක් විය. තව ද උපකුලපතිවරයාගේ ජංගම දුරකථන ඇමතුම් ගාස්තු රු. 66,612ක් ද විශ්ව විද්‍යාලය විසින් නිරවුල් කර තිබුණි.

3.2.3 අවිධිමත් බඳවා ගැනීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) රාජකාරී භාර ගැනීමත් පසු විශ්ව විද්‍යාලයේ වර්ෂ 08ක සේවය සම්පූර්ණ කර තිබුණු පර්යේෂණ සංරචකය සහිතව පශ්චාත් උපාධියක් ලබා ගැනීමට අසමත් වූ කථිකාචාර්යවරුන් තිදෙනෙකු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය ප්‍රකාරව සේවය අවන් නොකර විශ්ව විද්‍යාලයේ සේවය කිරීමට ඉඩදී තිබුණි.

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය ප්‍රකාර කථිකාචාර්ය වරුන් හතර දෙනෙකුගේ රාජකාරී භාර ගැනීමේ දිනයන් ගෙන් වර්ෂ 08කට පසු ඔවුන්ගේ සේවය අවසන් කර නොතිබුණි. ඒ වෙනුවට 1996 නොවැම්බර් මස 21 වැනි දිනැති අංක 721 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විවෘත දැන්වීමක් ප්‍රසිද්ධ නොකර ඔවුන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙස උසස් කර තිබුණි.

(ඇ) මාස දෙකක් පමණක් සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ බලන ප්‍රධානියා ලෙස ක්‍රියා කරනු ලැබූ නිලධාරියෙකු 1985 අංක 7 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 49(1) වගන්තියේ ප්‍රතිපාදනවලට පටහැනිව පීඨාධිපති ලෙස උසස් කර තිබුණි.

(ඈ) සහකාර කථිකාචාර්ය වරයකු ලෙස වර්ෂ 8ක් කටයුතු කරන ලද නිලධාරියෙකු ඔහුගේ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ නමුත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රයේ III පරිච්ඡේදයේ 21.1.1 වගන්තිය ප්‍රකාරව වසර 8ක් අවසානයේ දී ඔහුගේ සේවය අවසන් කර නොතිබුණි. ඒ වෙනුවට ඔහු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු ලෙස ඉස්ලාමීය අධ්‍යයන සහ ආරාබි භාෂා දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස සහ ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨයේ පීඨාධිපති ලෙස ද උසස් කර තිබුණි.

3.2.4 නිශ්ඵල වියදම්

ගිනි ගැනීමේ සිද්ධියක් පිළිබඳ පරීක්ෂා කිරීමට පුද්ගලයන් තුන් දෙනෙකුට ගෞරවාන්විත දීමනා ලෙස රු. 85,000ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් එම පුද්ගලයන් විසින් පරීක්ෂණය මේ දක්වා අවසන් කර නොතිබුණි.

3.2.5 නිශ්කාර්ය සහ ඌණ උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය තුළ දී මිලදී ගත් රු. 20,82,934ක් වටිනා පොත් ශිෂ්‍යයන්ගේ පාවිච්චිය සඳහා පුස්තකාලයට භාර නොදී කිසිදු ප්‍රයෝජනයට නොගෙන අදාල පීඨයන් සහ දෙපාර්තමේන්තු වල තබා තිබුණි.

3.2.6 අත්තිකාරම් ප්‍රදානය සහ නිරවුල් කිරීමේ අක්‍රමිකතා

(අ) විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය විසින් අත්තිකාරම් ලෙස ලබාගත් රු. 4,86,000ක් මාස 3-12 දක්වා කාල පරාසයක් ප්‍රමාදවීමෙන් පසු පාවිච්චියට නොගෙන ආපසු ගෙවා තිබුණු අතර, එය මුදල් තාවකාලික අයථා පරිහරණයට යොමුවීමක් විය හැක.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී සහ පෙර වර්ෂයේ දී කාර්ය මණ්ඩලය විසින් ලබාලත් රු. 16,90,877ක් 2007 දෙසැම්බර් මස 31 වැනි දිනට නිරවුල් නොකර පැවතුණි.

3.2.7 වාහන උපයෝජනය

විශ්ව විද්‍යාල වාහන ඇණියේ වාහන 10ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) විශ්ව විද්‍යාලයේ වාහන දහයේ දෛනික ධාවන සටහන් අනුව සමාලෝචිත වර්ෂය තුළ දී වාහන කි. මී. 231,275ක් ක්‍රියා කර ඉන්ධන ලීටර් 22,511ක් පාවිච්චි කර තිබුණි. කෙසේ නමුත් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය (ශ්‍රී. ලං. ග. ම.) විසින් එක් එක් වාහනයේ ඉන්ධන පාවිච්චිය පිළිබඳ දෙන ලද සහතිකයට අනුව වාහන ලීටර් 16,918ක් පාවිච්චි කළ යුතුව තිබුණි. ඒ අනුව දළ වශයෙන් පරිවැය රු. 4,34,273ක් වූ ඉන්ධන ලීටර් 5,593ක අතිරික්ත පාවිච්චියක් නිරීක්ෂණය විය.

(ආ) වාහනවල ටැංකියේ ධාරිතාව ඉක්මවා ඉන්ධන පාවිච්චි කළ නොහැකි වුව ද එසේ පාවිච්චි කළ බවට සඳහන් බිල්පත් ගෙවීම් වවුචර්වලට අමුණා තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාලය සතුව වාහන 10ක ඇණියක් තිබුණ ද පෞද්ගලික පාර්ශවයන්ගෙන් අමතර වාහන කුලියට ගෙන කුලී ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 29,31,491ක් ගෙවා තිබුණි. වාහන උපයෝජනයේ දී ආර්ථික බව ක්‍රියාත්මක කර නොතිබුණි. නිලධාරීන් සමූහ වශයෙන් ප්‍රවාහනය කිරීමට ගමන් සංවිධානය කර නොතිබුණි. ඒ වෙනුවට තනි ගමනට එක් නිලධාරියෙක් ගමන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් දුර ගමන් සඳහා වාහන හතරක් පමණක් පවතින බවත් ඒ අනුව පෞද්ගලික වාහන කුලියට ගත් බව උපකුලපති වරයා සඳහන් කර තිබුණි.

3.2.8 පුස්තකාල ආරක්ෂක පද්ධතිය ප්‍රසම්පාදනය

පුස්තකාලයට ආරක්ෂක පද්ධතියක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. 73,02,500ක ගෙවීමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය :-

(අ) ටෙන්ඩර් කැඳවීමට පෙර පිරිවිතරයන් තීරණය කර නොතිබුණි. ඒ වෙනුවට ටෙන්ඩර්කරු විසින් දෙන ලද පිරිවිතරයන් මත පදනම්ව තීරණය ගෙන තිබුණි.

(ආ) එක ටෙන්ඩරයක් පමණක් පදනම් කරගෙන එකතුව රු. 73,50,000ක ප්‍රසම්පාදන කටයුතු සඳහා තිරණය කර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව මෙම පද්ධතිය පිහිටුවීම 2007 ජනවාරි 07 වැනි දිනට පෙර නිම කළ යුතුව තිබුණි. කෙසේ නමුත් එය 2008 ජූනි මස 30 වැනි දින වන විටත් නිම කර නොතිබුණි. ප්‍රමාණ කල අලාභ අයකර ගෙන නොතිබුණි.

(ඈ) පුස්තකාලය සඳහා මෙම කාරණය සඳහාම 2005/2006 වර්ෂය තුළදි බාකෝඩ් පද්ධතියක් රු. 11,92,980කට මිලදී ගෙන තිබුණි. කෙසේ නමුත් මෙම පද්ධතිය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා තිබුණි. ඒ අනුව දරන ලද සම්පූර්ණ වියදම නිෂ්ඵල බවට පත්ව තිබුණි.

මේ සම්බන්ධයෙන් පුස්තකාල ආරක්ෂක පද්ධතිය ප්‍රසිද්ධ ටෙන්ඩර් යටතේ ප්‍රසම්පාදනය කළ අතර, පිරිවිතර ද ඇතුළත්ව ටෙන්ඩර් ලියකියවිලිවල සියලුම අවශ්‍යතාවයන් අඩංගුව තිබුණි. ඒ අනුව ලැබුණු ටෙන්ඩර් සැකසුම් කරන ලදී. ටෙන්ඩරයේ වටිනාකම රුපියල් මිලියන 20ට අඩු බැවින් විශ්ව විද්‍යාල ටෙන්ඩර් මණ්ඩලය විසින් ක්‍රියා කරන ලද බව ද උපකුලපති වරයා සඳහන් කර තිබුණි.

3.2.9 බැඳුම්කරු සහ ගිවිසුම් කඩවීම

ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් ආපසු දිවයිනට නොපැමිණීම හෝ ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ සේවය අත්හැර යාම සම්බන්ධ තොරතුරු/විස්තර විශ්ව විද්‍යාලය විසින් විගණනයට ලබාදී නොතිබුණි. ඒ අනුව බැඳුම්කර සහ ගිවිසුම් කඩවීම සම්බන්ධයෙන් කථිකාචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල නිගමනය කිරීමට නොහැකි විය.

3.2.10 වත්කම් සත්‍යාපනය

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 1996 සිට වත්කම් සම්බන්ධ භෞතික සත්‍යාපනය කර නොතිබුණි.

3.2.11 අය වැයට එරෙහි විශාල විචලනයක්

අයවැය ගත වියදම සහ තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස පාවිච්චි කර නොතිබුණු බව පෙන්නුම් කෙරිණි.

3.2.12 නේවාසිකාගාර පරිපාලනය

පහත නිරීක්ෂයන් කරනු ලැබේ :

(අ) ශේෂ පත්‍ර දිනට ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු නේවාසිකාර ගාස්තු ලෙස උපලේඛනයේ රු. 1,10,700ක මුදලක් දක්වා තිබුණ ද විස්තර ඉදිරිපත් කර තිබුණේ. රු. 31,500කට පමණි.

(ආ) නේවාසිකාර දේපළවලට පළමු, දෙවැනි හා තුන්වැනි වර්ෂවල ශිෂ්‍යයන්ගෙන් සිදුවී ඇති හානි සහ පාඩු නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. අවසන් වර්ෂයේ ශිෂ්‍යයන්ගෙන් සිදුවී හානි සහ පාඩු වටිනාකම රු. 34,035ක් ලෙස වටිනාකම් කර තිබුණි. කෙසේ නමුත් මෙම පාඩු අයකර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී අනාවර්ණය වූ අඩුපාඩු 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාවෙන් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) බඩු වට්ටෝරු පොත නඩත්තුව
(ඇ) ණයගැතියෝ
(ඈ) ගිණුම් කරණය
(ඉ) අත්තිකාරම් නිරවුල් කිරීම

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

මගේ අංකය : එෆ්ඒ/වීසී/බී/ඒජී/2007

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 07.
2009.03.16

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

යථෝක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක එන්ඊ/ඒඑම්/බ/එස්යූඑස්එල්/2007 හා 2008 දෙසැම්බර් මස 31 වැනි දිනැති ලිපිය පිළිබඳව අපගේ නිරීක්ෂණයන් පහත පරිදි වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රකාශන

විශ්ව විද්‍යාල පද්ධතිය තුළ පොදු භාවිතය වන්නේ අරමුදල් සපයන ලද ව්‍යාපෘති වාර්ෂික ගිණුම් වලට අන්තර්ගත නොකිරීමයි. කෙසේ නමුත් IRQUE ව්‍යාපෘතියේ ගිණුම් ඉදිරි පරිශීලනය පිණිස විශ්ව විද්‍යාල වාර්ෂික ගිණුම් තුළට අන්තර්ගත කළෙමු. ඒ ආකාරයෙන්ම CIDA ගිණුම් ද වාර්ෂික ගිණුම් වලට ඇතුළත් කරන්නෙමු.

2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

(අ) දැනටමත් ප්‍රතිශෝධනය කොට ඇත.

(ආ) ඍජු හර කිරීම් රු. 34,31,063ක මුදල දැනටමත් සැසඳීම් කොට අදාල ගිණුම් වලට ගලපා ඇත.

(ඇ) සියළුම පොත් සටහන් ප්‍රතිශෝධනය කොට ඇත.

(ඈ) භාවිතයෙන් ඉවත් කරන ලද මෝටර් රථ වාහන සඳහා වූ ක්ෂය වෙන් කිරීම් දැනටමත් නිවැරදි ලෙස ගිණුම්ගත කර ඇත.

(ඉ) රු. 3,26,211ක් වැය කරමින්, සමන්තුරේ ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි ඉදිකරන ලද වැට තවමත් එලෙසම පවතී.

(ඊ) මෙම වටිනාකම් අදාල ගිණුම් වලින් කපා හැරීමට දැනටමත් කටයුතු ආරම්භ කොට ඇත.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) වාර්ෂික ගිණුම් අවසන් කිරීමට පෙර 2007.12.31 දිනට පැවති ණය ශේෂ තහවුරු කරන මෙන් ණය ගැතියන්ගෙන් හා ණයහිමියන්ගෙන් විමසන ලද නමුත් ඉන් කිහිප දෙනෙක් පමණක් ප්‍රතිචාර දක්වන ලදී.

(ආ) නොපියවා පවතින ණය ශේෂයන් විශ්ව විද්‍යාලයේ කලින් සේවය කරන ලද මිය ගිය, ඉල්ලා අස්වුනු හෝ අනිවාර්ය නිවාඩු යවන ලද සේවකයන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් වන අතර, ඒවා ඔවුන්ගේ "සේවක අර්ථසාධක අරමුදල් " නිදහස් කරන අවස්ථාවේදී එමගින් අයකර ගැනීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත.

(ඇ) ඉදිරි ගිණුම් සමග ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කරන්නෙමි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවීම

මෙය සමන්විත වන්නේ,

- නේවාසිකාගාර වශයෙන් කුලියට ගන්නා ලද නිවාස සඳහා ගෙවූ කුලිය
- ආරාධිත විශ්ව විද්‍යාල වෛද්‍ය නිලධාරීන් සඳහා ගෙවූ ගාස්තු
- තොග සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් සඳහා ගෙවූ ගාස්තු

යනාදයෙනි.

ඉහත වියදම් සම්බන්ධයෙන් වූ ලිපිලේඛන අදාල වවුචර් පත් සමග අමුණා ඇති අතර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී.

2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ), (ආ), (ඇ) සහ (ඈ)

අප විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළිපදිනු ලැබූ අතර එය විගණන මතය මගින්ද පිළිබිඹු වේ.

මාස හයක කාල සීමාව ඉක්ම වූ චෙක්පත් අවලංගු කිරීමට කටයුතු ආරම්භ කොට ඇත.

හානි ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු යොදා ඇත්තෙමු.

ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ ලිපිවල අනුපිටපත් විගණකාධිපතිවරයා වෙත යැවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

සියළුම විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සපයන ලද අතර ඒවායේ පිටපත් අදාල බලධාරීන් වෙත ද තැපෑලෙන් යැවීමට කටයුතු කරන ලදී.

(ඉ) ආයතන සංග්‍රහය

(i) ආයතන සංග්‍රහයේ XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය-

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ පැමිණීමේ ලේඛනය දෙපාර්තමේන්තු මට්ටමේ අධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රධානියා විසින් පවත්වාගෙන යනු ලබයි.

(ii) XXVII පරිච්ඡේදයේ 09 ඡේදය-

පරිපාලන අංශය විසින් වාහන සම්බන්ධයෙන් වූ ලොග් පොත් පවත්වාගෙන යනු ලබයි.

(ඊ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

(i) 1980 පෙබරවාරි මස 25 වැනි දිනැති අංක 63හි 6(3) වගන්තිය - ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

(ii) 1997 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 48 ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

(iii) 2002 අගෝස්තු මස 02 වැනි දිනැති අංක 807

පසුගිය වසර 05ක කාලය තුළ ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය වෙත කිසිදු ස්ථිර අභ්‍යන්තර විගණන නිලධාරිවරයෙකු අනියුක්ත කර නොතිබුණු බැවින් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් කැඳවීමට නොහැකි විය.

2.2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ චක්‍රලේඛ ලිපි හා මාර්ගෝපදේශිත ප්‍රකාරව අංක (අ) හා (ආ) සඳහා වූ ගෙවීම් සිදුකර ඇත.

2.2.7 අධිකාරි බලයක් නොමැති ගෙවීම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ වැඩ බලන ලේඛකාධිකාරීවරයා පත්කර ඇත.

(ආ) සෑම අස්ථාවකදීම, පාලක සභාවේ අනුමැතිය සහිතව අතිරේක වැඩ සඳහා වූ ගෞරව දීමනාව ගෙවා ඇත.

2.2.8 ඉක්මවා කළ ගෙවීම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ වලට අනුකූලව පශ්චාත් උපාධි නිබන්ධන සඳහා වූ ගෙවීම් සිදුකර ඇත.

03. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 පර්යේෂණ ප්‍රදානයන්ගේ උපයෝජනය

(අ) සියළුම ලිපිගොනු මේ වන විට යාවත්කාලීන කර ඇත.

(ආ) පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව (RPC) විසින් ඇතැම් පර්යේෂකයන් වෙත පර්යේෂණ කාලය දීර්ඝ කිරීම සඳහා අවසර ලබා දී ඇත.

(ඇ) පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ තීරණ වලට අනුකූලව, පර්යේෂණ අත්තිකාරම් අයකර ගැනීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇති අතර, හිඟව පැවති පර්යේෂණ අත්තිකාරම් වලින් කොටසක් දැනටමත් අයකර ගෙන ඇත.

3.2.2 ආර්ථිකමය නොවන ගණුදෙනු

(අ) පරිගනක හා ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියාව හා නවීකරණය සඳහා වූ වියදම්, පුනරාවර්තන ප්‍රදාන මගින් ගෙවා ඇත. එසේම, උපකරණ මිලදී ගැනීම සඳහා පුනරාවර්තන ප්‍රදාන උපයෝගී කර ගත නොහැකි විය.

(ආ) අරමුදල් සැපයීමට නියමිත අනාගත නියෝජිතයන් වෙත ව්‍යාපෘති යෝජනාවේ ඡායා පිටපත් කොළඹ දී ලබාදීම සඳහා අවශ්‍යතාවය මත මෙම පිරිවැය දැරීමට සිදු විය.

(ඇ) උප කුලපතිතුමන් විසින් එක් ස්ථාවර දුරකථනයක් සහ ජංගම දුරකථනයක් පමණක් භාවිතා කරයි. එසේ නමුත්, සහකාර ලේඛකාධිකාරීවරයා සහ ෆැක්ස් යන්ත්‍රය සඳහා වෙන් වෙන්ව සම්බන්ධතාවයන් ලබා දී ඇත. තවද, පොලීසිය හා විශ්ව විද්‍යාල ආරක්ෂක අංශය විසින් සංචාරක නිවාසයේ දුරකථන සම්බන්ධතාවය භාවිතා කරනු ලබයි.

3.2.3 අක්‍රමවත් බඳවා ගැනීම්

(අ) විශ්ව විද්‍යාල සේවා කාලය වසර 08ක් සම්පූර්ණ කළ, එහෙත් පශ්චාත් උපාධි පාඨමාලාවක් සම්පූර්ණ නොකරන ලද කථිකාචාර්යවරුන්ගේ සේවය අත්හිටුවා තාවකාලික කථිකාචාර්යවරුන් ලෙස සේවයේ අනියුක්ත කරන ලදී. එසේම වසර 08 ඉක්ම වූ පසු ඔවුන් සඳහා ගෙවන ලද වැඩිපුර ගෙවීම් අයකර ගන්නා ලදී.

3.2.4 ඵලදායී නොවන වියදම්

වාර්තාව ඉදිරිපත් කොට ඇත.

3.2.5 නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

ශිෂ්‍යයන්ගේ හා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පරිශීලනය සඳහා පීඨ පුස්තකාලය සඳහා රු. 2,082,934 ක් වටිනාකමැති පොත් මිලදී ගන්නා ලදී.

3.2.6 අත්තිකාරම් ප්‍රදානය කිරීමේ දී හා පියවීමේ දී වූ අක්‍රමිකතා

(අ) ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

(ආ) 2007 දෙසැම්බර් මාසයට පෙර කාර්යය මණ්ඩල සඳහා ප්‍රදානය කරන ලද අත්තිකාරම් පසුව පියවන ලදී. නමුත් 2007 දෙසැම්බර් මාසයේ දී 2008 ජනවාරි මස පැවති වාර්ෂික උපාධි ප්‍රදානෝත්සව පෙර සූදානම් කටයුතු වෙනුවෙන් පිරිනැමූ අත්තිකාරම් විගණන දිනය වන විටත් නොපියවා හිඟව පැවතුණි.

3.2.7 රථ වාහන උපයෝජනය

(අ) රථ වාහන බොහෝමයක් වසර දහයකටත් අධික කාලයකදී මිලට ගත් ඒවා බැවින් ඒවායේ ධාවන පිරිවැය ඉතා ඉහල අගයක් ගනියි. මේවායින් බොහෝමයක් භාණ්ඩාගාරයේ අනුමැතිය යටතේ දැනටමත් භාවිතයෙන් ඉවත්කර ඇත.

(ආ) මෙය නැවත ඉතා සියුම් ලෙස පරීක්ෂාවට ලක් කොට වෙනස නිවැරදි කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව පවතී.

(ඇ) වාහන දහයෙන් හයක් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර ධාවන කටයුතු සඳහා යොදා ගන්නා අතර, දුරගමන් සඳහා යොදා ගත හැක්කේ වාහන හතරක් පමණි. එම නිසා දුරගමන් සඳහා අමතර වාහන අවශ්‍ය වන අවස්ථාව වලදී පමණක් විශ්ව විද්‍යාලය මගින් පෞද්ගලික වාහන, කුලී පදනම මත ලබා ගෙන ඇත.

කුලී රථ සඳහා වැයවන වියදම් අඩු කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී අවධානය යොමු කරන්නෙමු.

3.2.8 පුස්තකාල ආරක්ෂක පද්ධතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

පුස්තකාල ආරක්ෂක පද්ධතිය ප්‍රසම්පාදනය කර ඇත්තේ, පොදු ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය යටතේ ය. අදාල ටෙන්ඩර් ලියකියවිලි වල පිරිවිතරයන් ද ඇතුළුව සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත. එසේම ලැබුණු ටෙන්ඩරයේ වටිනාකම රුපියල් මිලියන විස්ස නොඉක්ම වූ හෙයින් විශ්ව විද්‍යාලීය ටෙන්ඩර් මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය) යටතේ ක්‍රියාත්මක කරන ලදී.

3.2.9 බැදුම්කර හා ගිවිසුම් උල්ලංඝනය කිරීම

බැඳුම්කර උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් සියළුම හිඟ මුදල් අයකර ගැනීමට නිවාඩු සහ නිවාඩු ප්‍රදානය කිරීමේ කමිටුව මගින් දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.2.10 වත්කම් සත්‍යාපණය

2006 වර්ෂය දක්වා භෞතික සත්‍යාපණයක් සිදුකර ඇත.

3.2.11 අය-වැයට එරෙහිව වූ ප්‍රධාන විචලනයන්

ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

3.2.12 නේවාසිකාගාර පරිපාලනය

විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් විසින් සිදු කරන ලද අලාභ/හානි වල ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ පාඩු, අදාල ශිෂ්‍යයන්ගෙන්, ඔවුනට උපාධි සහතික පත් ප්‍රධානය කරන අවස්ථාවේ දී නිරන්තරයෙන් ම අයකරගනු ලබයි.

(ආ) අවස්ථා බොහෝමයකදී මෙම තනතුරු සඳහා දැන්වීම් පළ කලත් විශ්ව විද්‍යාලය ඉතා දුරස්ථ හා දුෂ්කර ප්‍රදේශයක පිහිටා ඇති බැවින් අධ්‍යයන කාර්‍ය්‍ය මණ්ඩලය සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන මණ්ඩල නිලධාරීන් ආකර්ෂණය කර ගැනීමට අපහසු විය. එම නිසා වසර 08 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සහ පශ්චාත් උපාධියක් හිමි කථිකාචාර්යවරුන් තාවකාලික පදනමින් බඳවා ගැනීමට විශ්ව විද්‍යාල පාලක සභාව විසින් තීරණය කරන ලදී.

(ඇ) සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ බලන දෙපාර්තමේන්තු ප්‍රධානියා කිසිදු දිනක උසස් වීම් ලබා නොමැත. පීඨ මණ්ඩලයේ බහුතර ඡන්දයෙන් ඔහුව පීඨාධිපති වශයෙන් තෝරා පත්කර ගන්නා ලදී.

(ඈ) අදාල කථිකාචාර්යවරයා වසර පහකට අධික කාලයක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස සේවයේ නියුක්ත වී ඇත. විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛවලට අනුකූලව ඔහුව I ශ්‍රේණියට උසස් කරන ලදී. එසේම ඔහු දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස අනුයුක්ත කරන ලද්දේ, එවකට සේවයේ යෙදී සිටි එකම ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යය මණ්ඩල කථිකාචාර්වරයා ද ඔහු වූ බැවිනි. පසුව පීඨ මණ්ඩලය විසින් ඔහුව පීඨාධිපති ලෙස තෝරා පත් කර ගන්නා ලදී. එසේ හෙයින් අපගේ ස්ථිර හැඟීම වන්නේ උක්ත පත්වීමේ කිසිදු අවිධිමත්බවක් නොමැති බවයි.

**04. පද්ධති හා පාලන**

සටහන් කර ගන්නා ලදී

(අ), (ආ), (ඇ) සහ (ඈ) යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අපගේ විශේෂ අවධානය යොමු කරමු.

ආචාර්ය ඒ. ජී. හුසේන් ස්මයිල්,
උප කුලපති.

*පිටපත්* : 01. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
02. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.
03. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| *දෙසැම්බර් 31 වැනි දිනට* | | *2007* | | *2006* | |
|---|---|---|---|---|---|
| *වත්කම්* | *සටහන්* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 77,94,23,872 | | 67,65,04,769 | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 2 | 79,46,200 | | 36,07,068 | |
| | | 78,77,03,072 | 78,73,70,072 | 68,01,11,837 | 68,01,11,837 |
| කෙරීගෙන යන වැඩ | 3 | | 8,08,63,364 | | 6,82,51,668 |
| | | | 86,82,33,435 | | 74,83,63,505 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 4 | 45,30,459 | | 36,45,875 | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 5 | 6,74,75,695 | | 4,72,50,109 | |
| මුදල්, මුදල් හා සමාන දෑ | 6 | 82,75,704 | 8,02,81,858 | 88,15,558 | 5,97,11,542 |
| මුළු වත්කම් | | | 94,85,15,293 | | 80,80,75,047 |
| **වගකීම්** | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 4,07,99,568 | | 1,90,26,978 | |
| උපචිත වියදම් | | - | | | |
| නිශ්චිත අරමුදල් | 8 | 76,92,360 | 4,84,91,928 | 87,22,361 | 2,77,49,339 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 9 | 2,88,49,787 | | 2,86,12,143 | |
| ක්ෂය සඳහා වෙන් කිරීම | | 29,16,95,206 | 32,05,44,993 | 25,36,64,448 | 28,22,76,591 |
| මුළු වගකීම් | | | 36,90,36,921 | | 31,00,25,930 |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **57,94,78,372** | | **49,80,49,117** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| සමුච්චිත අරමුදල | 10 | | 86,78,22,998 | | 75,57,19,043 |
| සංචිත | | | (28,83,44,626) | | (25,76,69,926) |
| **මුළු වත්කම්/හිමිකම්** | | | **57,94,78,372** | | **49,80,49,117** |

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*2007 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

වියදම් එහි ස්වභාවය අනුව වර්ගීකරණය කර නිරූපණය කර ඇත :

| *මෙහෙයුම් ආදායම* | *සටහන්* | *2007* | *2006* |
|---|---|---|---|
| පුනරාවර්තනය ප්‍රදාන | | 20,92,39,000 | 17,65,00,000 |
| අනෙකුත් ප්‍රදාන | 11 | 4,56,03,094 | 2,98,44,282 |
| | | 25,48,42,094 | 20,63,44,282 |

| *මෙහෙයුම් ආදායම* | *සටහන්* | *2007* | *2006* |
|---|---|---|---|
| **මෙහෙයුම් වියදම්** | | | |
| පෞද්ගලික පඩිනඩි | | 14,94,22,608 | 12,07,41,582 |
| ගමන් | | 25,93,276 | 18,60,004 |
| සැපයුම් සහ පාරිභෝජන භාණ්ඩ | | 1,16,28,320 | 77,88,931 |
| නඩත්තු | | 84,83,717 | 1,47,28,339 |
| ගිවිසුම්ගත සේවා | | 3,10,67,794 | 3,04,81,152 |
| පර්යේෂණ සහ ප්‍රකාශන | | 3,11,06,037 | 2,01,13,719 |
| ක්ෂය කිරීම් | | 4,10,03,684 | 5,55,22,126 |
| අයි. ආර්. ක්යු. යු. ඊ. | | 2,20,37,426 | 1,14,74,810 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **29,93,42,862** | **26,27,10,563** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබූ අතිරික්තය/(ඌනතාවය) | | (4,45,00,768) | (5,63,66,281) |
| මූල්‍ය පිරිවැය | | - | - |
| දේපළ, පිරියත උපකරණ විකිණීමෙන් ලද ආදායම | | - | - |
| මුළු මෙහෙයුම් නොවන ආදායම | | - | - |
| අසාමාන්‍ය අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | | (4,45,00,768) | (5,63,66,281) |
| පෙර වර්ෂයේ ගැලපුම් | | (1,38,32,068) | (4,93,336) |
| **කාලච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)** | | **(3,06,74,700)** | **(5,58,72,945)** |

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය**

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය* | *2007* | *2006* |
|---|---|---|
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය (ඌනතාවය) | (3,06,74,700) | (5,58,72,945) |
| **මුදල් නොවන චලනයන්** | | |
| ක්ෂය කිරීම් | 3,80,30,758 | 3,92,54,842 |
| වෙනත් | - | - |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් වල වැඩිවීම | 2,37,644 | 1,62,67,284 |
| | 75,93,702 | (3,50,819) |
| සේවක පිරිවැය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම | - | - |
| ජංගම වත්කම්වල වැඩිවීම/අඩුවීම | 8,44,584 | (5,72,070) |
| ලැබිය යුතු දෑවල වැඩිවීම/අඩුවීම | 2,02,25,585 | 1,46,79,391 |
| ජංගම වගකීම්වල වැඩිවීම/අඩුවීම | 2,07,42,589 | 1,27,75,197 |
| | 3,67,580 | (13,32,125) |
| මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 72,26,122 | (16,82,944) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ සහ පිරියත මිලදී ගැනීම | 11,98,69,931 | 9,87,47,204 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 11,26,43,809 | (10,04,30,148) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | 11,21,03,955 | 10,39,14,966 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (5,39,854) | 34,84,818 |
| කාල පරිච්ඡේදය ආරම්භයේ දී පැවති මුදල්, මුදල් හා සමාන දෑ | 88,15,558 | 53,30,740 |
| කාල පරිච්ඡේදය අවසානයේ දී පැවති මුදල්, මුදල් හා සමාන දෑ | 82,75,704 | 88,15,558 |

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

### ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ III වැනි වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2009 සැප්තැම්බර් මස 07 වැනි දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගනණයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂයය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වැනි වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**2. *මූල්‍ය ප්‍රකාශන***

2.1 මතය :

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2008 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම් :

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතන ව්‍යාපෘතිය (CIDA) සඳහා රු. 1,33,79,219 වියදමක් දරා තිබුණි. කෙසේ වුව ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18ට අනුව ක්ෂය උපලේඛනය පිළියෙල කර නොතිබුණි.

2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

විගණනයේ දී පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය :

(අ) ගිණුම්වල දක්වා තිබුණු එකතුව රු. 85,84,25,330ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම පොත් අගය පදනම් කරගෙන තිබුණි. කෙසේ වුව ද මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුළ දී සිදුකර නොතිබුණි ;

(ආ) ඇතැම් බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන ඍජු හර හා ඍජු බැර හර පිළිවෙලින් එකතුව රු. 13,26,602ක් හා රු. 3,50,604ක් විමර්ශනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි ;

(ඇ) තාප්පයක් ඉදිකිරීම සඳහා කඩා දමා තිබුණු වැටක වටිනාකම වූ රු. 3,26,211ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස අඛණ්ඩව දක්වා තිබුණි ;

(ඈ) සුනාමි ආපදාව හේතුවෙන් නැතිවූ/හානි වූ රු. 22,372ක වටිනාකම වූ ක්‍රීඩා භාණ්ඩ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා තිබුණි ;

(ඉ) ප්‍රාග්ධන ස්වභාවයේ වූ එකතුව රු. 14,000ක වියදම් සාවද්‍යව පුනරාවර්තන වියදමට අයකර තිබුණි ;

(ඊ) ආදායමට වැඩි වියදම් අතිරික්තය ශේෂ පත්‍රයේ වෙනම විෂයයක් ලෙස දැක්වීමෙන් තොරව වර්ෂයෙන් වර්ෂය සාවද්‍යව පොදු සංචිත ගිණුමට හර කර තිබුණි ;

(උ) එක් එක් ස්ථාවර වත්කමෙහි ඵලදායී ආයු කාලය, මිළදී ගත් දිනය සහ ස්ථාවර වත්කම් අයිතමවල පාඩුව සැලකිල්ලට නොගෙන ක්ෂය ගණනය කර තිබුණි. ඒ වෙනුවට 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට එක් එක් වත්කම් කාණ්ඩයෙහි ලෙජර් ශේෂය පදනම් කරගෙන ගිණුම්වල ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි ;

(ඌ) ජිම්නාස්ටික් කාමරයේ සවිකළ කණ්නාඩිය සහ වීදුරුවේ වටිනාකම සඳහා රු. 4,29,840ක් වූ ගෙවීම පුනරාවර්තන වියදමක් ලෙස සලකා වියදම් ගිණුමට අයකර තිබුණි ;

(එ) පර්යේෂණ ප්‍රදානවලට අදාළ නිලධාරියෙකුගෙන් අයකරගන්නා ලද රු. 32,895ක් හා කුඩා බෑගයක වටිනාකම අදාළ ගිණුම්වලට බැර කර නොතිබුණි ;

(ඒ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මිළදී ගත් පොත් සහ කාලීන සඟරාවල වටිනාකම රු. 63,43,878ක් වූ අතර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ඉදිරිපත් කරන ලද ප්‍රකාශනයට අනුව පොත්වල වටිනාකම රු. 77,52,957ක් විය. රු. 14,09,079ක් වූ වෙනස පිළිබඳව පැහැදිලි කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල පොත් සඳහා ගෙවන ලද මුදල බවත්, පුස්තකාලයාධිපති දක්වා තිබුණේ පොත්වල ඇණවුම් වටිනාකම බවත් මේ සම්බන්ධයෙන් උප කුලපති දන්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) විශ්වවිද්‍යාලයට ලැබිය යුතු රු. 1,69,51,396ක් වූ සේවක ණය ශේෂයන් වර්ෂ 1ට වැඩි කාලයක් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් නිරවුල් කර නොතිබුණි.

(ආ) සේවය අතහැර ගිය/විශ්‍රාම ගිය/සේවයෙන් පහ කරන ලද විශ්වවිද්‍යාල සේවකයන් විසින් රු.5,21,914ක් වූ ණය ශේෂයන් වර්ෂ 1කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ණය ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල දැක්වෙන එකතුව රු. 4,68,47,547ක් වූ විෂයයන් 18ක් ලේඛන, ලිපිගොනු, වියදම් විස්තර බිල්පත්, අතිරේක වැඩ විස්තර, ලැබීම් සඳහා ලදුපත් හා සනාථ කිරීම් නොමැතිවීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ ඇතැම් විධිවිධානවලට අනුකූල නොවීම් විය.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත :

(i) 109 වගන්තිය

(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය ඃ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

(i) 2002 අගෝස්තු මස 02 වැනි දිනැති අංක 807 ;

(ii) 1997 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 48 ;

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය ඃ

XXVII පරිච්ඡේදය 3.1 වගන්තිය
XXVII පරිච්ඡේදයේ 9 වගන්තිය

(ඈ) මුදල් රෙගුලාසි ඃ

අංක 110, 700(5), 702(3) සහ 396 (ඈ)

(ඉ) ආයතන සංග්‍රහය ඃ

XIV පරිච්ඡේදයේ 8.2 වගන්තිය

(ඊ) 2008 ජූනි මස 26 වැනි දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.

03. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයේ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු. 35,44,60,840ක් ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 29,55,40,594ක ඌනතාවයක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලද රු. 25,18,37,978ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පසුව සමලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය රු.10,26,22,855 දක්වා අඩු වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලද රු. 25,10,39,826ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පසුව එම වර්ෂයේ ඌනතාවය රු. 4,45,00,768 දක්වා අඩු වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලවල රු. 5,81,22,087ක් තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

3.1.2 දෘශ්‍ය අක්‍රමිකතා/අවිධිමත් ගනුදෙනු

පර්යේෂණ යෝජනා 13ක් සඳහා අත්තිකාරම් වශයෙන් රු. 4,49,800ක් ගෙවා තිබුණි. කෙසේ වුව ද පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම් කිහිපයක් ලබාදී තිබුණ ද කිසිදු යෝජනාවක් නිමකර නොතිබුණි. පසුව අදාළ නිලධාරීන්ගෙන් අත්තිකාරම් ආපසු අයකර ගැනීම සඳහා තීරණයක් ගෙන තිබුණි. කෙසේ වුව ද පර්යේෂකයන්ට ගෙවන ලද අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.1.3 අත්තිකාරම් ලබාදීමේ හා නිරවුල් කිරීමේ අක්‍රමිකතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ ඃ

(අ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබුණු රු. 1,32,000ක් මාස 3-12ක කාල පරාසයක ප්‍රමාදයකින් පසුව තාවකාලිකව මුදල් අවිධිමත් පරිහරණයට හේතුවන පරිදි උපයෝජනය කිරීමෙන් තොරව ආපසු ගෙවා තිබුණි ;

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය විසින් ලාබාගෙන තිබුණු රු. 5,65,200ක් 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට පියවා නොතිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කාර්ය සාධනය

(අ) ලියාපදිංචි ශිෂ්‍යයින්ගේ විස්තර

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ පීඨයන්හි ලියාපදිංචි වූ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 1 වර්ෂය | 2 වර්ෂය | 3 වර්ෂය | 4 වර්ෂය | එකතුව |
| (i) කලා හා සංස්කෘතික | 243 | 199 | 146 | 31 | 619 |
| (ii) කළමනාකරණ හා වාණිජ | 52 | 54 | 59 | 75 | 240 |
| (iii) ව්‍යවහාරික විද්‍යාව | 51 | 47 | 49 | - | 147 |
| (iv) ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂාව | 78 | 43 | 10 | 02 | 133 |
| **එකතුව** | **424** | **343** | **264** | **108** | **1139** |

(ආ) ඒක ශිෂය පිරිවැය

විගණනය සඳහා ලබාගත හැකි වූ තොරතුරු අනුව මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1,138ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා දරන ලද මුළු පිරිවැය රු. 36,21,73,596ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු. 3,18,254ක් විය.

(ඇ) විභාග

සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද විභාග සහ නිකුත් කරන ලද ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත දැක්වේ :-

| පීඨය | විභාගය පවත්වන කාලය | විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| කලා | 2008 ජූලි | 770 | 722 |
| කළමනාකරණ හා වාණිජ | 2008 ජූලි | 358 | 291 |
| ව්‍යවහාරික විද්‍යාව | 2008 ජනවාරි | 284 | 151 |
| ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂාව | 2008 ජූලි | 156 | 146 |
| එකතුව | | 1,568 | 1,310 |

3.2.2 නිශ්ඵල වියදම්/අත්හැර දමන ලද ව්‍යාපෘති

පහත නිරීක්ෂනයන් කරනු ලැබේ :-

(අ) විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පස් පරීක්ෂාව හා පර්යේෂණ සඳහා එක්සත් රාජධානිය පදනම් කරගත් උපදේශක සමාගමකට (ARUP) 2006 වර්ෂය තුළ දී එකතුව රු. 1,68,66,550ක ගෙවීම් කර තිබුණි. නොනිමි වැඩ ගිණුම යටතේ මෙම මුදල 2008 දක්වා අඛණ්ඩව දක්වා තිබුණි. කෙසේ වුව ද විශ්වවිද්‍යාලය විසින් පස් පරීක්ෂාව හෝ පර්යේෂණ පිළිබඳ කිසිදු වාර්තාවක් ලබාගෙන නොතිබුණි. විශ්වවිද්‍යාලය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පසුව අත්හැර දමා තිබුණු හෙයින් මෙම ගෙවීම ඵල රහිත වියදමක් බවට පත් වී තිබුණි ;

(ආ) පුස්තකාලයට ආරක්ෂක පද්ධතියක් මිල දී ගැනීම සඳහා 2007 වර්ෂය තුල එකතුව රු. 73,02,500ක ගෙවීම් සිදුකර තිබුණු අතර 2005/2006 වර්ෂ තුළ පුස්තකාලයට බාර් කෝඩ් පද්ධතියක් (Bar Code System) මිළදී ගැනීම සඳහා රු. 11,92,980ක් වැය කර තිබුණි. කෙසේ වුවද 2008 දෙසැම්බර් මස 31 වැනි දින විටත් විශ්ව විද්‍යාලය විසින් ඉහත පද්ධතීන් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2.3 ආර්ථික නොවූ ගනුදෙනු

වියදම පිළිබඳ පාලනයක් නොමැතිව අධ්‍යාපන සංවර්ධනය සඳහා වෙන් කර තිබුණු අරමුදල්වලින් රැස්වීම්වලට සහභාගි වූවන් සහ සුභසාධනය සඳහා රැස්වූවන් සඳහා ආහාර හා කෑම බීම සැපයීමට සමාලෝචිත වර්ෂය තුළ රු. 13,46,173ක් වූ වියදමක් දරා තිබුණි.

3.2.4 නිෂ්කාර්ය වත්කම්

රු. 3,91,688ක් විටිනාකම වූ පාරිභෝජ්‍ය විෂයයන් හතක් අදහස් කළ කාරණා සඳහා යොදා ගැනීමෙන් තොරව වර්ෂ 4කට වැඩි කාලයක් නිෂ්කාර්යව තබා තිබුණි.

3.2.5 වැඩිපුර ගෙවීම්

පරිගණක සඳහා කන්ඩෙන්සර් 50ක් සහ ට්‍රාන්සිස්ටර්ස් 27ක් මිලදී ගැනීම සඳහා එකතුව රු. 53,350ක ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වුව ද, වැඩ නිම කිරීමේ වාර්තාවලට අනුව, කන්ඩෙන්සර් 40ක් සහ ට්‍රාන්ස්සිස්ටර්ස් 20ක් සවිකර තිබුණු බව දක්වා තිබුණි. ඒ හේතුවෙන් රු .13,350ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

3.2.6 වාහන උපයෝජනය

ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8.2 වගන්තියට සහ 2008 ජුනි මස 26 වැනි දිනැති 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව පදිංචි ස්ථානය හා සේවා ස්ථානය අතර ගමන් කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ පීඨයන්හි අංශ ප්‍රධානීන් (Deans) හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට 2008 ජුනි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු. 3,21,337ක් වූ ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

3.2.7 හඳුනාගන්නා ලද පාඩු

සමාලෝචිත වර්ෂය තුළ දී පළමුවැනි දෙවැනි සහ තුන්වැනි වර්ෂවල ශිෂ්‍යයින් විසින් නේවාසිකාගාර දේපළවලට සිදුකර තිබූ පාඩු හා හානි නිශ්චය කර නොතිබුණි. අවසාන වර්ෂයේ ශිෂ්‍යයින් විසින් සිදුකර තිබුණු පාඩු හා හානි රු. 8,810ක් ලෙස නිශ්චය කර තිබුණි.

3.2.8 බැඳීම් ගිවිසුම් කඩ කිරීම

අධ්‍යයන නිවාඩු මත විදේශගත වූ කථිකාචාර්යවරුන් කිහිප දෙනෙකු නියමිත දිනයන් තුළ ආපසු පැමිණ නොතිබුණු අතර විශ්වවිද්‍යාලය විසින් එම කථිකාචාර්යවරුන් සමග එළඹ තිබුණු එකතුව රු. 91,11,848ක් වූ බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.2.9 වත්කම් සමීක්ෂණය

(අ) විශ්වවිද්‍යාලයේ වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණ 1996 වර්ෂයේ සිට සිදුකර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ සියලු ඉන්වෙන්ටරි විෂයයන් පරීක්ෂාකර නිශ්චය කර ගැනීම සඳහා ප්‍රධාන ඉන්වෙන්ටර් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.2.10 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුවක් සමාලෝචිත වර්ෂය තුළ දී සතුටුදායක ලෙස ක්‍රියාත්මකව නොතිබුණි.

3.2.11 අභ්‍යන්තර විගණනය

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

3.2.12 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර විශාල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ :-

(අ) ස්ථාවර වත්කම් ;
(ආ) ඉන්වෙන්ටරි ලේඛන පැවැත්වීම ;
(ඇ) ණයගැතියෝ ;
(ඈ) ගිණුම්කරණය.

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

මගේ අංකය : එෆ්ඒ/වීසී/බී/ඒජී/2008.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

### ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක එන්ඊ/ඒඑම්/බී/එස්ඊයූඑස්එල්/2008 හා 2008 දෙසැම්බර් මස 31 වැනි දිනැති ලිපිය පිළිබඳව අපගේ නිරීක්ෂණයන් පහත දැක්වේ :

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රකාශන

(අ) විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පොදු භාවිතය වන්නේ අරමුදල් සපයන ලද ව්‍යාපෘති වාර්ෂික ගිණුම් ප්‍රකාශනවලට අන්තර්ගත නොකිරීමයි. කෙසේ නමුත් IRQUE ව්‍යාපෘතියේ ගිණුම් ඉදිරි පරිශීලනය පිණිස විශ්වවිද්‍යාල වාර්ෂික ගිණුම් තුලට අන්තර්ගත කළෙමු. ඒ ආකාරයෙන් ම CIDA ගිණුම් ද වාර්ෂික ගිණුම්වලට ඇතුළත් කරන්නෙමු.

(ආ) ඉදිරිපත් කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශනයේ 1.3.3 (බී) ඡේදය මගින් ක්ෂය සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගන්නා ලද අතර මේ සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු කරමු ;

(ආ) සෘජු හර කිරීම් රු. 13,26,602ක් සහ සෘජු බැර කිරීම් රු. 3.50,604ක් දැනටමත් සැසැඳීම් කොට අදාළ ගිණුම්වලට ගලපා ඇත ;

(ඇ) රු. 3,26,211ක් වැය කරමින් සම්මන්තුරේ ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි ඉදිකරන ලද වැට තවමත් එලෙසම පවතී ;

(ඈ) මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි ;

(ඉ) මෙය නිවැරදි කර ඇත ;

(ඊ) ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි ;

(උ) ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි ;

(ඌ) මෙය නිවැරදි කර ඇත ;

(එ) සෙබස්තියන් පිල්ලේ මහතාට දෙන ලද බ්‍රීෆ්කේසයේ පිරිවැයට හා පර්යේෂණ අත්තිකාරමට සමාන මුදලක් එනම් රු. 32,895ක් හිලව් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අප වෙත ප්‍රේෂණය කර ඇත. මෙම මුදල ගිණුම් අංක 11801හි තැන්පත් කරන ලද අතර (2005.06.02 දිනැති කුවිතාන්සි අංක 4535න්) එය අදාල ලෙජර් ගිණුමේ ශේෂය සමගින් ගැලපුම් කරනු ලැබේ ;

(ඒ) පුස්තකාලයාධිපති විසින් දක්වන ලද වටිනාකම්, ඉන්වෙන්ට්‍රි වටිනාකම දක්වන තුරු මූල්‍ය ප්‍රකාශන මගින් පොත් සඳහා ගෙවන ලද වටිනාකම පෙන්වනු ලබයි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම වටිනාකම මගින් විශ්වවිද්‍යාලයේ සේවකයින්ට ප්‍රදානය කළ ආපදා ණය වටිනාකම පෙන්නුම් කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍ර ලේඛන ප්‍රකාරව අයකර ගැනීම් ක්‍රමිකව සිදු කරනු ලබයි ;

(ආ) නොපියවා පවතින ණය ශේෂයන් විශ්වවිද්‍යාලයේ කලින් සේවය කරන ලද, මියගිය, සේවයෙන් ඉල්ලා අස්වුණු හෝ අනිවාර්ය නිවාඩු යවන ලද සේවකයන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් වන අතර, ඒවා ඔවුන්ගේ "සේවක අර්ථසාධක අරමුදල් " නිදහස් කරන අවස්ථාවේ දී, එමගින් අයකර ගැනීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත.

2.2.4 විගණනය සඳහා සාක්ෂි ප්‍රමාණවත් නොවීම

වාර්තාවේ සඳහන් රු. 4,68,47,547ක ණයගැති වටිනාකමින් සහ රු. 4,30,53,819ක ණයහිමි වටිනාකමින්,

වාර්ෂික ගිණුම් අවසන් කිරීමට කලින් 2008.12.31 දිනට හිඟවී පැවතුන ණයගැති ශේෂ සහ ණයහිමි ශේෂ තහවුරු කරන මෙන් ණයගැතියන්ගෙන් සහ ණයහිමියන්ගෙන් ඉල්ලා ඇතත් ඔවුන්ගෙන් කිහිප දෙනෙකු පමණක් ඊට ප්‍රතිචාර දක්වන ලදී.

වටිනාකම රු. 37,93,728ක වියදම් සඳහා වූ ලිපි ලේඛන අදාල වවුචර්පත් සමග අමුණා ඇති අතර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී :-

- නේවාසිකාගාර සඳහා කුලියට ගන්නා ලද නිවාස සඳහා ගෙවූ කුලිය

- ආරාධිත විශ්ව විද්‍යාල වෛද්‍ය නිලධාරීන් සඳහා ගෙවූ ගාස්තු

- තොග සමීක්ෂණ නිලධාරීන් සඳහා ගෙවූ ගාස්තු

යනාදියෙනි

2.2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

(i) 109 ඡේදය

2008 දෙසැම්බර් මස 31 වැනි දිනට විගණකාධිපතිගේ වාර්තාව සහ එම වාර්තාවට යොමු කරන ලද නිරීක්ෂණ මේ වන විටත් රජයේ මුද්‍රණාලය වෙත බාරදී ඇත.

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ

(i) 2002 අගෝස්තු මස 02 වැනි දිනැති අංක 807

පසුගිය වසර 05ක කාලය තුළ ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය වෙත කිසිඳු අභ්‍යන්තර විගණන නිලධාරියකු අනුයුක්ත කර නොතිබුණු බැවින් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.

(ii) 1997 නොවැම්බර් මස 02 වැනි දිනැති අංක 48 දරන ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යනු ලබයි.

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය.

(i) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ පැමිණීමේ ලේඛණය එක් එක් දෙපාර්තමේන්තු මට්ටමේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රධානියා විසින් පවත්වාගෙන යනු ලබයි.

(ii) XXVII පරිච්ඡේදයේ 9 වගන්තිය

පරිපාලන අංශය විසින් වාහන සම්බන්ධයෙන් ලොග් පොත් පවත්වාගෙන යනු ලබයි.

(ඈ) මුදල් රෙගුලාසි අංක 110, 700(5) සහ 702(3)

ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

මුදල් රෙගුලාසි 702 (3)

මේ වන විට, අත්සන් කරන ලද ගිවිසුමේ පිටපතක් සුපුරුදු පරිදි විගණකාධිපති වෙත යවා ඇත.

මුදල් රෙගුලාසි 396 (ඩී)

මස 06ක කාලසීමාව ඉක්ම වූ චෙක්පත් අවලංගු කර ඇත.

3.0 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.2 දෘෂ්‍ය අනුක්‍රමිකතා/අක්‍රමවත් ගෙවීම් :

පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුවේ තීරණය පරිදි පර්යේෂණ යෝජනා 13ක් සඳහා ප්‍රදානය කළ අත්තිකාරම් මේ වන විටත් අයකරගෙන ඇත.

3.1.3 අත්තිකාරම් ප්‍රදානයේ දී හා පියවීමේදී පවත්නා අක්‍රමිකතා :

(අ) ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි

(ආ) මෙම සියලුම අත්තිකාරම් දැන් පියවා ඇත

3.2.2 නාස්තිකාර වියදම්/අත්හරින ලද ව්‍යාපෘති

(අ) ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශකවරයා වශයෙන් ARUP ආයතනය කටයුතු කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. මහා භාණ්ඩාගාරය විසින් 2006 වර්ෂයේ වියදම් සඳහා රුපියල් මිලියන 15ක් අනුමත කරන ලදී. ප්‍රධාන සැලැස්ම නිසි පරිදි සකස් කිරීම සඳහා ARUP ආයතනය පත් කළ නමුත් කිසිදු පස් සාම්පල පරීක්ෂාවක් හෝ පර්යේෂණයක් සිදු නොකරන ලදී. ප්‍රාරම්භක මූලික සැලැස්ම විශ්ව විද්‍යාලයට භාරදෙන ලදී. කුවේට් ආධාර ප්‍රදාන ව්‍යාපෘතිය සඳහා වූ සංකල්ප පත්‍රිකාව මෙම ප්‍රධාන සැලැස්ම මත පදනම් වී තිබුණි. විශ්ව විද්‍යාලයට අවසන් ප්‍රධාන සැලැස්ම ලබා ගැනීම සඳහා ඉතිරි මුදල ගෙවීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි 2007 අගෝස්තු මස 06 වැනි දිනැති ලිපිය මගින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇත.

(ආ) ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලයේ පාඨ ග්‍රන්ථ සඳහා තීරු සංකේත වැඩ සටහනක් පිහිටවීම මේ වන විටත් සම්පූර්ණ කර ඇත. එය ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරීමට ආසන්න මට්ටමේ පවතී. ඔලුවිල්හි ප්‍රධාන පුස්තකාලය සඳහා RFID ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම පෙරසැරි මට්ටමේ පවතී. මෙම පද්ධතිය WINISS සිට KOHA ඒකාබද්ධ පුස්තකාල තොරතුරු පද්ධතිය දක්වා ආනයනය කිරීමට සිදුවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට බලය පැවරීම ප්‍රමාද විය.

3.2.3 ආර්ථිකමය නොවන ගණුදෙනු

ලෝක බැංකුව අනුමත කළ ව්‍යාපෘතියක් යටතේ "සාමාජීය සහජීවනය" වර්ධනය කිරීම සහ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩ සටහන සඳහා ශිෂ්‍යයන්, විශ්ව විද්‍යාලීය ප්‍රජාව සහ විශ්ව විද්‍යාල කෙරෙහි ඇල්මක් දක්වන අනෙකුත් පාර්ශ්වයන්ද සම්බන්ධ වූ අතර ඒ සඳහා ශ්‍රමදාන, සංස්කෘතික චාරිකා, වැඩමුළු යනාදිය ඇතුළත් විය.

3.2.4 නිෂ්කාර්ය වත්කම්

ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කරන්නා ලද අතර අදාළ වත්කම් ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නෙමි.

3.2.5 ඉක්මවා කළ වියදම්

පරිගණක අළුත්වැඩියාව සඳහා මිලදී ගත් "ධාරිත්‍රක සහ ට්‍රාන්සිස්ටර් " සියල්ලම උපයෝජනය කර අති අතර කිසිඳු ඉක්මවා ගෙවීමක් සිදුකර නොමැත. වැඩ සම්පූර්ණ කළ බවට සහතික කළ වැඩ වාර්තාවක් ප්‍රයෝජනය සඳහා ඇත.

3.2.6 මෝටර් රථ වාහන උපයෝජනය

විශ්ව විද්‍යාලය විසින් 2008 ජනවාරි සිට ජුනි දක්වා කණ්ඩායම් ප්‍රවාහන පහසුකමක් සපයන ලදී. ප්‍රවාහන පහසුකම්වල පවතින දුෂ්කරතාවය සහ පීඨාධිපතිවරුන්ගේ ඉල්ලීම් ද සලකා බලා පාලක සභාව විසින් පීඨාධිපතිවරුන්හට විශ්ව විද්‍යාලයේ සිට සහ විශ්ව විද්‍යාලය දක්වා රාජකාරි කටයුතු සඳහා ගමන් කිරීමට ස්වකීය වාහන භාවිතා කිරීමට අවසර දෙන ලදී. එමෙන්ම මෙම ප්‍රතිපත්තිය සමහර විශ්ව විද්‍යාලවල ක්‍රියාත්මක වීම ද මෙයට හේතුවක් විය.

3.2.7 හඳුනාගත් පාඩු - නේවාසිකාගාරය

විශ්ව විද්‍යාල සිසුන්ගේ අලාභහානි හේතුකොටගෙන සිදුවූ පාඩු, අදාල ශිෂ්‍යයන්ගෙන් ඔවුනගේ සහතික පත්‍ර ප්‍රදානය කරන අවස්ථාවේදී සැමවිටම අයකරගනු ලබයි.

3.2.8 බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම

අධ්‍යයන නිවාඩු මත විදේශ ගතවූ පහත සඳහන් කථිකාචාර්යවරුන් ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ සේවයට මේ දක්වා වාර්තාකර නොමැත.

1. පී. ගෝපාල්රාජා මයා, කථිකාචාර්ය (පරිවාස)
2. එම්. එම්. එම්. මාහිර් මයා, පරිඝනක පිළිබඳ උපදේශක
3. ඒ. ආර්. එම්. ඉම්තියාස් මයා, කථිකාචාර්ය (පරිවාස)
4. එම්. එම්. එම්. රාෆික් මයා, කථිකාචාර්ය (පරිවාස)

පී. ගෝපාල්රාජ මයා සම්පූර්ණ බැඳුම්කර මුදලම විශ්ව විද්‍යාලයට ගෙවා ඇත එම්. එම්. එම්. මාහිර් මහතා රු. 50,000ක මූලික මුදලක් ගෙවා ඇති අතර ඉතිරිය විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇත. සමාන ආකාරයෙන්ම, ඒ ආර්. එම්. ඉම්තියාස් මයාගේ සහ එම්. එම්. එම්. රාෆික් මයාගේ බැඳුම්කර මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

3.2.9 වත්කම් සත්‍යාපනය

(අ) 2006 වර්ෂය දක්වා භෞතික සත්‍යාපනයක් සිදුකර ඇති අතර මෙම ව්‍යායාමය 2010 වර්ෂ අවසානය දක්වා ද ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සකසා ඇත.

(ආ) ප්‍රධාන ඉන්වෙන්ටරි ලේඛනය ප්‍රයෝජනය සඳහා පරිපාලනය අංශයේ පවතී.

3.2.10 විගණන සහ කළමනාකරණ කමිටු

මෙම කමිටුවේද කැඳවුම් කරුවා වන අභ්‍යන්තර විගණකයකු අප විශ්ව විද්‍යාලය සඳහා පත්කර දෙන මෙන්, අපි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත්තෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස මේ වර්ෂයේ බඳවා ගැනීම් වලින් අභ්‍යන්තර විගණකයකු අප වෙත ලබා දීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහතික වී ඇත.

3.2.11 අභ්‍යන්තර විගණනය

අප ආයතනය සඳහා අභ්‍යන්තර විගණකයෙකු ලබාදෙන මෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වසරේ බඳවා ගැනීම් වලින් කෙනෙකු ලබා දීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහතික වී ඇත.

3.2.12 අයවැයමය පාලනය

ඉදිරි අනුකූලතාවය සඳහා සටහන් කර ගතිමි.

**4. පද්ධති හා පාලන**

සටහන් කර ගතිමි

වාර්තාවේ දක්වා ඇති (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) කරුණු කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු කරන්නෙමු.

ආචාර්ය එස්. එම්. මොහොමඩ් ඉස්මයිල්
උපකුලපති.

පිටපත් : ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ලේකම්, මුදල් සහ සැළසුම් අමාත්‍යාංශය,
සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| *දෙසැම්බර් 31 වැනි දිනට* | | *2008* | | *2007* | |
|---|---|---|---|---|---|
| | *සටහන්* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 85,84,25,330 | | 77,94,23,872 | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 2 | 88,83,632 | | 79,46,200 | |
| | | 86,73,08,962 | 86,73,08,962 | 78,73,70,072 | 78,73,70,072 |
| කෙරීගෙන යන වැඩ | 3 | | 12,22,32,481 | | 8,08,63,364 |
| | | | 98,95,41,442 | | 86,82,33,435 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 4 | 64,07,015 | | 45,30,459 | |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 5 | 5,76,88,594 | | 6,74,75,695 | |
| මුදල්, මුදල් හා සමාන දෑ | 6 | 44,65,893 | 6,85,61,503 | 82,75,704 | 8,02,81,858 |
| මුළු වත්කම් | | | 1,05,81,02,946 | | 94,85,15,293 |
| **වගකීම්** | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 4,30,53,818 | | 4,07,99,568 | |
| උපචිත වියදම් | - | - | | | |
| නිශ්චිත අරමුදල් | 8 | 37,08,241 | 4,67,62,059 | 76,92,360 | 4,84,91,928 |

| *දෙසැම්බර් 31 වැනි දිනට* | *සටහන්* | *2008* *රු. ශත* | *2008* *රු. ශත* | *2007* *රු. ශත* | *2007* *රු. ශත* |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වගකීම් : | | | | | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 9 | 3,22,87,289 | | 2,88,49,787 | |
| ක්ෂය සඳහා වෙන් කිරීම | | 38,71,71,946 | 41,94,59,234 | 29,16,95,206 | 32,05,44,993 |
| මුළු වගකීම් | | | 46,62,21,293 | | 36,90,36,921 |
| මුළු ශුද්ධ වත්කම් | | | 59,18,81,652 | | 57,94,78,372 |
| ශුද්ධ වත්කම්/හිමිකම් | | | | | |
| සමුච්චිත අරමුදල | 10 | | 98,21,43,430 | | 86,78,22,998 |
| සංචිත | | | (39,02,61,778) | | (28,83,44,626) |
| **මුළු වත්කම්/හිමිකම්** | | **59,18,81,652** | | | **57,94,78,372** |

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

වියදම් එහි ස්වභාවය අනුව වර්ගීකරණය කර නිරූපණය කර ඇත.

| **මෙහෙයුම් ආදායම** | *සටහන්* | *2007* *රු. ශත* | *2008* *රු. ශත* |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | | 21,55,00,000 | 20,92,39,000 |
| අනෙකුත් ප්‍රදාන | 11 | 4,40,50,741 | 4,56,03,094 |
| | | 25,95,50,741 | 25,48,42,094 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පෞද්ගලික පඩිනඩි | | 15,00,65,791 | 14,94,22,608 |
| ගමන් | | 25,81,582 | 25,93,276 |
| සැපයුම් සහ පාරිභෝජන භාණ්ඩ | | 1,54,82,497 | 1,16,28,320 |
| නඩත්තු | | 1,01,53,465 | 84,83,717 |
| ගිවිසුම්ගත සේවා | | 4,34,13,844 | 3,10,67,794 |
| පර්යේෂණ සහ ප්‍රකාශන | | 2,71,87,699 | 3,11,06,037 |
| ක්ෂය කිරීම් | | 9,54,76,740 | 4,30,03,684 |
| අයි. ආර්. ක්යු. යූ. ඊ. | | 1,78,11,978 | 2,20,37,426 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **36,21,73,596** | **2,99,342,862** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබූ අතිරික්තය/(ඌනතාවය)** | | **(10,26,22,855)** | **(4,45,00,768)** |
| මූල්‍ය පිරිවැය | | - | - |
| දේපළ, පිරියත, උපකරණ විකිණීමෙන් ලද ආදායම | | - | - |
| මුළු මෙහෙයුම් නොවන ආදායම | | - | - |
| අසාමාන්‍ය අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | | (10,26,22,855) | (4,45,00,768) |
| පෙර වර්ෂයේ ගැලපුම් | | 7,05,703 | 1,38,26,068 |
| **කාලච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)** | | **(10,19,17,152)** | **(3,06,74,700)** |

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

### ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය* | *2008* *රු. ශත* | *2009* *රු. ශත* |
|---|---|---|
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය (ඌනතාවය) | (10,19,17,152) | (3,06,74,700) |

| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය* | *2008* *රු. ශත* | *2009* *රු. ශත* |
|---|---|---|
| **මුදල් නොවන චලනයන්** | | |
| ක්ෂය කිරීම් | 9,54,76,740 | 3,80,30,758 |
| වෙනත් | - | - |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම්වල වැඩිවීම | 34,37,502 | 2,37,644 |
| | (30,02,911) | 75,93,702 |
| සේවක පිරිවැය සඳහා වෙන් කිරීම් වල වැඩිවීම | - | - |
| ජංගම වත්කම්වල වැඩිවීම/අඩුවීම | 18,76,556 | 8,84,584 |
| ලැබිය යුතු දෑවල වැඩිවීම/අඩුවීම | (97,87,100.60) | 2,02,25,585 |
| ජංගම වගකීම්වල වැඩිවීම/අඩුවීම | (17,29,869) | 2,07,42,589 |
| | 61,80,675 | (3,67,580) |
| **මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 31,77,765 | 7,22,122 |
| අයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ සහ පිරියත මිලදී ගැනීම | 12,13,08,006 | 11,98,69,931 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (11,81,30,242) | (11,26,43,809) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ප්‍රධාන | 11,43,20,432 | 11,21,03,955 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (38,09,809) | (5,39,854) |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී පැවති මුදල්, මුදල් හා සමාන දෑ | 82,75,704 | 88,15,558 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී පැවති මුදල් මුදල් හා සමාන දෑ | 44,65,893 | 82,75,704 |

12-1040/3

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 290159.
වික්‍රම ආරච්චිගේ ආනන්ද ගුණසේකර.
වික්‍රම ආරච්චිගේ චමින්ද ගුණසේකර.

2001 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2006 මාර්තු මස 30 වැනි දින සහතික කරන ලද අංක 8370 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චිගේ ආනන්ද ගුණසේකර සහ වික්‍රම ආරච්චිගේ චමින්ද ගුණසේකර යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන පහක් සහ පනස් දෙදහස් එකසිය විසිතුනයි ශත හැත්තෑ අටක (රු.5,052,123.78) මුදලක් 2010 මැයි මස 21 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රුපියල් මිලියන පහක් සහ පනස් දෙදහස් එකසිය විසිතුනයි ශත හැත්තෑ අටක මුදල (රු.5,052,123.78) අය කර ගැනීම සඳහා සහ 2010 මැයි මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 4,231,246.12 ක මුදල මත 14% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 8370 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලැබේ.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් 1988 ජූනි මස 5 වැනි දින සාදන ලද පිඹුරු අංක 1988/41 හි දැක්වෙන වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බටහිර කටුගම්පොල හත්පත්තුවේ මැදපත්තු කෝරළේ උඩුගම ගම්මානයේ පිහිටි මාකුල්ලගහමුලවත්ත සහ මීගහමුලවත්ත කියන ඉඩමේ ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එච්. එම්. පොඩිඅප්පුහාමිට අයිති පිඹුරු අංක 1260 හි පිහිටි ලොට් ඒ නම් කොටස වෙන් කරන කම්බි සහ විදුලි වැට ද, නැගෙනහිරට : පෙර කී පිඹුරු අංක 1988/41 තුළ පිහිටි ලොට් 2 කොටස ද, දකුණට : පිඹුරු අංක 1988/41 හි පිහිටි ලොට් 5 නම් මාර්ග වෙන්කරය ද, බස්නාහිරට : ප්‍රධාන මහා මාර්ගය ද යන මායිම් තුළ පෙර කී පිඹුරු

අංක 1988/41 ට අනුව අක්කර එකයි රූඩ් දෙකක් විශාල ඉඩම (අ. 1, රූ. 2 පර්. 0) කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L226/161 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත කී පිඹුරු අංක 1988/41 හි නිරූපිත ලොට් 5 නම් මාර්ග වෙන්කරය මතින් ගමන් කිරීම සහ වැඩි දියුණු කර පවත්වාගෙන යාම සහ අයිතිවාසිකම් ද සමගයි.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

12-1087

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.10.14 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2006.10.10 දිනැති අංක 5270 දරන උකස්කරය මත ණය ගිණුම සඳහා රුපියල් හාරලක්ෂ හැත්තෑ දෙදහස් පන්සිය හැට නවයයි ශත හැට නවයක (රු. 4,72,569.69) මුදල් ද අයිරා ගිණුම සඳහා ඉතිරි රුපියල් තුන්ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය පහයි ශත අසූහතක (රු. 3,42,405.87) මුදල් ද (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් දොළොස් දහස් පන්සිය හැටයි ශත විසි එකක (රු. 12,560.21) මුදල බැහැර කොට) ණය ගිණුම හා අයිරා ගිණුම සඳහා 2010.09.03 වැනි දින තෙක් පොළිය ද, ගෙවීමට තිබෙන ණය මුදල වන රුපියල් දෙලක්ෂ හැට දහසක (රු. 2,60,000) මුදල් මත 2010.09.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දාහතරක (14%) හා අයිරා ශේෂය වන රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදල් මත 2010.09.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට පහළොවක (15%) වාර්ෂික පොළියක් ද හිඳගල, මහකන්ද, අංක 12 දරන ස්ථානයේ පිහිටි "සින්චියර් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්" හි අයිතිකරු වන චමින්ද මංජුල සිරිමාන්න යන අයගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2006.10.10 දිනැති අංක 5270 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් අටලක්ෂ දහහතර දහස් නවසිය හැත්තෑ පහයි ශත පනස් හයක (රු. 8,14,975.56) මුදල සමග (2010.09.30 වැනි දින තෙක් ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් දොළොස් දහස් පන්සිය හැටයි හත විසි එකක (රු. 12,560.21) මුදල බැහැර කොට) 2010.09.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එකී සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට, ගන්දහය කෝරළේ, ගුරුදෙනියේ පිහිටි මහනුවර බලයලත් මිනින්දෝරු පී. ඩබ්. විජේවර්ධන මයා විසින් සාදන ලද 1993 නොවැම්බර් මස 25 වැනි දිනැති අංක 4833 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති (මහනුවර බලයලත් මිනින්දෝරු ඒ. බී, වීරසේකර මයා විසින් සාදන ලද 1987 නොවැම්බර් මස 16 හා 17 වැනි දිනයන් හි 2539 දරන පිඹුරේ කැබලි අංක 1 හි කොටසක් වූ) "සින්නහරාගම හෙවත් මාලිගාතැන්න වත්තේ කොටසක්" වන ඉහත කී පිඹුරු අනුව උතුරට : මහ පාර ද, නැගෙනහිරට : අංක 2539 දරන පිඹුරේ කැබලි 2 වෙන් කරන ජීව වැට ද, දකුණට : ඇළ ද, බස්නාහිරට : එන් ගනේෂන් නැමැත්තාට අයත් ඉඩම වෙන් කරන ජීව වැට ද මායිම් වූ රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම පහක (අ. 0, රූ. 1, පර්. 38.5) වපසරියෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති සෑම සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 387/208 පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩබ්. ජයසුන්දර මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
මහනුවර.

12-1110

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (387 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.10.14 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2005.06.17 දිනැති අංක 3953 හා 2008.06.24 වැනි දිනැති අංක 6291 දරන උකස්කර දෙක මත මුල් මුදල් හා 2010.07.06 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හත්ලක්ෂ හැටහත් දහස් තුන්සිය තිස්පහයි ශත හතලිස් දෙකක (රු. 7,67,335.42) මුදල සමග රුපියල් හයලක්ෂ එක්දහස් එකසිය නවයයි ශත හතලිස් හයක (රු. 6,01,109.46) මුද මත 2010.07.07 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට දහහතරක (14%) වාර්ෂික පොළියක් ද, රජවැල්ල, දිගන, අළුත්වත්ත පාරේ, අංක 15 දරන ස්ථානයේ පදිංචි බාලසුබ්‍රමනියම් චන්ද්‍රකුමාර් මයා යන අයගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2005.06.17 වැනි දිනැති අංක 3953 හා 2008.06.24 වැනි දිනැති අංක 6291 දරන උකස්කර දෙක මත අයවිය යුතු රුපියල් හත්ලක්ෂ හැට හත්දහස් තුන්සිය තිස්පහයි ශත හතලිස් දෙකක (රු. 7,67,335.42) මුදල සමග 2010.07.07 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු

ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එකී සංශෝධනයන් යටතේ ද මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම මහනුවර, ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ ප්‍රධාන කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩ ගම්පහ කෝරළේ, කෙන්ගල්ල හි පිහිටි බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව මයා විසින් සාදන ලද 2004 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 3343 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "අළුත්වත්තේ කොටසක් " යයි හඳුන්වනු ලබන උතුරට : කැබලි 2 ද, නැගෙනහිරට : කැබලි 2 හා කම්බි වැට ද, දකුණට : පීපී. මහ. 4433 දරන පිඹුරේ කැබලි 18 හා දිගන සිට අළුත්වත්තට යන පාර ද, බස්නාහිරට : දිගන සිට අළුත්වත්ත පාරට යන පාර මතුතලය ලෙස පෙන්නුම් කර ඇති අංක 4433 දරන පිඹුරේ කැබලි 28 ද මායිම් වූ පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සියල්ල, එහි තුළ පිහිටා ඇති ගොඩනැගිලි, වගාවන් හා අනෙකුත් සෑම සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ ඊ 764/209හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පරිදි කෙන්ගල්ල හි පිහිටි බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව මයා විසින් සාදන ලද 2004 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 3343 දරන පිඹුරේ කැබලි 2 යනුවෙන් පෙන්නුම් කර ඇති "අළුත්වත්තේ කොටසක් " යයි හඳුන්වනු ලබන උතුරට : පිඹුරු අංක පීපී. මහ. 4433 දරන පිඹුරේ කැබලි 6 ද, නැගෙනහිරට : පිඹුරු අංක මහ. 4433හි කැබලි 25 සහ 18 ද, දකුණට : කැබලි 1 ද, බස්නාහිරට : පීපී. මහ. 4433 දරන පිඹුරේ කැබලි 28 යන්නෙන් පෙන්නුම් කර ඇති දිගන සිට අළුත්වත්ත පාරට යන පාර ද මායිම් වූ පර්චස් හයක (අ. 0, රූ. 0, පර්. 6) ප්‍රමාණයෙන් යුත් පාර සියල්ල භාවිතා කිරීමේ අයිතිය වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 764/210 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. කේ. ඩී. ඩබ්. එම්. එස්. දිවාරත්න මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

12-1111

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (387 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.10.14 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2003.01.10 දිනැති අංක 2564 හා 2006.09.22 වැනි දිනැති අංක 5232 දරන උකස්කර දෙක මත මුල් මුදල් (2010.07.06 දිනට ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද එකොලොස් ලක්ෂ හතලිස් හතරදහස් තුන්සිය හතලිස් හයයි ශත විසි පහක (රු. 11,44,346.25) මුදල බැර කොට) හා 2010.07.06 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිඅට ලක්ෂ හැත්තෑ හත්දහස් අටසිය හතලිස් හතයි ශත විසිතුනක (රු. 28,77,847.23) මුදල සහ රුපියල් විසිලක්ෂයක (රු. 20,00,000) මුදල මත (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද එකොලොස් ලක්ෂ හතලිස් හතර දහස් තුන්සිය හතලිස් හයයි ශත විසිපහක (රු. 11,44,346.25) මුදල බැහැර කොට) 2010.07.07 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට පහළොවක (15%) වාර්ෂික පොළියක් ද, මහනුවර, කොළඹ වීදියේ, අංක 44හි තිබූ දැනට මහනුවර හරස් වීදියේ අංක 23බී දරන ස්ථානයේ තිබෙන සීමාසහිත ඇන්ඩෲ හා ඩයානා (පෞද්ගලික) සමාගමෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2003.01.10 දිනැති අංක 2564 හා 2006.09.22 වැනි දිනැති අංක 5232 දරන උකස්කර දෙක මත අයවිය යුතු රුපියල් විසිඅට ලක්ෂ හැත්තෑ හත්දහස් අටසිය හතලිස් හතයි ශත විසිතුනක (රු. 28,77,847.23) මුදල (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් හතර දහස් තුන්සිය හතලිස් හයයි ශත විසිපහක (රු. 11,44,346.25) මුදල බැහැර කොට) සමග 2010.07.07 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරටය අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එකී සංශෝධනයන් යටතේ ද මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම මහනුවර, ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ ප්‍රධාන කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාව තුළ මාතලේ බෝගහකොටුවේ පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන මයා විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 2173ඒ දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "සියඹලාගහකොටුව" යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 2173ඒ දරන පිඹුර අනුව, උතුරට : මාර්ගය හා ජීව වැට ද, නැගෙනහිරට : කැබලි අංක 3 හා 2 ද, දකුණට : බිත්තිය හා මුස්ලිම් ප්‍රසිද්ධ සුසාන භූමිය ද, බස්නාහිරට : ජීව වැට සහ බෝගහකොටුව පාරේ වරිපනම් අංක 20/3 දරන ස්ථානය ද මායිම් වූ පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 108/98, 239 පිටුවල ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පරිදි මාතලේ බෝගහකොටුවේ පිහිටි ඉහත කී අංක 2173ඒ දරන පිඹුරේ කැබලි 2 යනුවෙන් පෙන්නුම් කර ඇති "සියඹලාගහකොටුව" යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 2173ඒ දරන පිඹුර අනුව, උතුරට : කැබලි 3 ද, නැගෙනහිරට : ජේ. එච්. ඒ. ගෆ්ෆගේ දේපළ සහ එස්ජ්එස් වෙසියලාගේ දේපළ ද, දකුණට : මුස්ලිම් ප්‍රසිද්ධ සුසාන භූමිය ද, බස්නාහිරට : කැබලි 1 ද මායිම් වූ පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද සියලු ඉඩම් කට්ටිය වේ. මෙය

මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 108/99, 240 පිටුවල ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. කේ. ඩී. ඩබ්. එම්. එස්. දිවාරත්න මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

12-1112

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (387 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.10.14 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2003.10.30 දිනැති අංක 3041 දරන උකස්කරය මත මුල් මුදල් (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් තිස්අටදහස් හයසිය හතලිස් නවයයි ශත හතලිස් එකක (රු. 38,649.41) මුදල බැහැර කොට) හා 2010.07.28 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් නවලක්ෂ හැත්තෑ හයදහස් දහහතයි ශත අනූවක (රු. 9,76,017.90) මුදල සමග අනුමත කළ සීමාව වන රුපියල් හත්ලක්ෂ පනස් දහසක (රු. 7,50,000) මුදල මත (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් තිස් අටදහස් හයසිය හතලිස් නවයයි ශත හතලිස් එකක (රු. 38,649.41) මුදල බැහැර කොට) 2010.07.29 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට පහළොවක (15%) වාර්ෂික පොලියක් ද මහනුවර, අනගාරික ධර්මපාල මාවතේ, අංක 160/1 දරන ස්ථානයේ පදිංචි අදිකාරම් වලව්වේ සරත් බණ්ඩාරනායක මයා යන අයගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2003.10.30 වැනි දිනැති අක 3041 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් නවලක්ෂ හැත්තෑ හයදහස් දහහතයි ශත අනූවක (රු. 9,76,017.90) මුදල (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් තිස් අටදහස් හයසිය හතලිස් නවයයි ශත හතලිස් එකක (රු. 38,649.41) මුදල බැහැර කොට) සමග 2010.07.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එකී සංශෝධනයන් යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර එළිය දිස්ත්‍රික්කයේ, කොහොන කෝරළේ, (නමුත් උඩහේවාහැට කෝරළේ, කොහොන පත්තුව යනුවෙන් ලියාපදිංචි කර ඇති) හඟුරන්කෙත ප්‍රාදේශීය සභා සීමාව තුළ, රිකිල්ලගස්කඩ ග්‍රාමයේ, හේවාහැට පාර දෙසට පිහිටා ඇති බලයලත් මිනින්දෝරු ඊ. ප්‍රනාන්දු මයා විසින් සාදන ලද 1998.03.01 වැනි දිනැති අංක 926 දරන පිඹුරේ කැබලි 2 යනුවෙන් පෙන්නුම් කර ඇති "කහටදෙනිය" යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 926 දරන පිඹුර අනුව, උතුරට : මහනුවර-හේවාහැට ප්‍රධාන පාර හා එම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස හා රාගල-මහනුවර මහ පාර ද, දකුණට : රාගල-මහනුවර ප්‍රධාන පාර හා කැබලි 1 ද, බස්නාහිරට : අංක 1 දරන කැබැල්ල හා හේවාහැට-මහනුවර මහ පාර ද මායිම් වූ පර්චස් නවයයි දශම අටයි අටක (අ. 0, රූ. 0, පර්. 9.88) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල එහි තුළ පිහිටා ඇති වරිපනම් අංක 39, 41 හා 43 දරන ගොඩනැගිලි හා අනෙකුත් සෑම සියලු දේත් වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ආර් 281/189 දරන පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩබ්. ජයසුන්දර මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
මහනුවර.

12-1108

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.11.24 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

